මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ
ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය









## ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අංශය

# කාර්යසාධන වාර්තාව - 2018

මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ
තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අංශය

# කාර්යසාධන වාර්තාව - 2018

# පටුන

පිටු අංකය

ගරු මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගේ පණිවිඩය v

ගරු ඛනිජතෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමියගේ පණිවිඩය ix

පෙරවදන - ලේකම්, මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය xi

1. ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති 01
2. ඛනිජතෙල් නිෂ්පාදන ආනයනය 08
3. ඛනිජතෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදා හැරීම 11
4. ඛනිජතෙල් නිෂ්පාදන අලෙවිය 16
5. යටිතල පහසුකම් සංවර්ධනය 25
6. ඛනිජතෙල් ගවේෂණය සහ සංවර්ධනය 35
7. ප්ලාස්ටික් අපද්‍රව්‍ය ඉන්ධන බවට පරිවර්තනය කිරීම 38
8. දේශීය වෙළඳපොළේ මිළ විචලනය 40
9. ආයතනික පරිපාලනය 44
10. ගිණුම් 58

# ගරු මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගේ පණිවිඩය



මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ඛනිජතෙල් සම්පත් සංවර්ධන අංශය සහ ඒ යටතේ පවතින ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සහ ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය යන ආයතන තුන එක්ව දියත් කරන ලද කාර්යන්හි ප්‍රගතිය ඇතුළත් ''කාර්යසාධන වාර්තාව - 2018'' නැමැති වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණකි. 2018 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ රටේ ඛනිජතෙල් අවශ්‍යතාවය සපුරාලීම සඳහා දියත්කරන ලද සේවාවන් පිළිබඳ මෙමගින් විස්තර කරනු ලබයි.

පෙර භාග, මධ්‍ය සහ පසුභාග ඛනිජතෙල් කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීමට වගකිවයුතු අමාත්‍යාංශය වශයෙන් එවකට සිටි ගරු අමාත්‍යතුමාගේ උපදෙස් මත ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යංශ විසින් ශ්‍රී ලංකාවේ ඛනිජතෙල් අංශයේ අභියෝග මගහරවා ගනිමින් 2018 වර්ෂය තුළදී ඉතා වැදගත් ප්‍රතිපත්තිමය තීරණ ගෙන ඇති අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

ඒ අනුව රටේ අඛණ්ඩ ඉන්ධන සැපයුම තහවුරු කිරීමට හැකිවන පරිදි ඛනිජතෙල් මිල දී ගැනීමේ ක්‍රියාවලිය විනිවිධභාවයෙන් යුක්තව සිදු කරනු ලබයි. එසේම, ඛනිජතෙල් නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාළ සේවාවන් කාර්යක්ෂමව හා ඵලදායීව පාරිභෝගිකයාට ලබාදීම සඳහා ඉතා වැදගත් වන ඉතා පැරණි යටිතල පහසුකම් පුනරුත්ථාපනයට හා සංවර්ධනයට අදාළ ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇත. කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ පවතින ගුවන්යානා ඉන්ධන සැපයුම් පද්ධතිය සහ ඉන්ධන නැවත පිරවීමේ පර්යන්තය ඉදිකිරීම මුතුරාජවෙල සිට කටුනායක දක්වා ජෙට් ඒ - 1 ප්‍රවාහනය කිරීමේ නළ පද්ධතිය කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය ඔස්සේ ඉදිකිරීම සහ ඒ ආශ්‍රිත පහසුකම් සංවර්ධනය, කොළඹ වරායේ සිට කොළොන්නාව පර්යන්තය දක්වා තෙල් ප්‍රවාහනය කරනු ලබන නළ පද්ධතිය ඉදිකිරීම, කොළොන්නාව, මුතුරාජවෙල සහ සපුගස්කන්ද පර්යන්තය අතර අන්තර් සම්බන්ධිත නළ පද්ධතිය ඉදිකිරීම, දිවයින පුරා ඉන්ධන තොගගබඩා ධාරිතාවන් පුළුල් කිරීම, ලිහිසිතෙල් මිශ්‍ර කිරීමේ කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීම, පාරිභෝගිකයන් මූලික කරගත් සේවාවක් සැපයීම සඳහා ප්‍රාදේශීය ඛනිජතෙල් තොග ගබඩා සංවර්ධනය කිරීම යනාදිය ඒ අතරින් ප්‍රධාන වේ.

මහාමාර්ග හා මාර්ග සංවර්ධන විෂයට අමතරව ඛනිජතෙල් සම්පත් සංවර්ධන විෂයභාර අමාත්‍යවරයා වශයෙන්, මාගේ ධූරකාලය තුළ පෙරභාග, මධ්‍ය සහ පසුභාග ඛනිජතෙල් කර්මාන්තය තිරසාරාත්මකව සංවර්ධනය කිරීම උදෙසා දැනටමත් සැලසුම්කර ඇති කාර්යයන් සමග අවශ්‍ය හා වැදගත් සියළු කටයුතු සිදුකරනු ලබන බවට තහවුරු කරමි. වර්තමානයේ මාගේ අමාත්‍යාංශයට එහි ආයතන සමග එක්ව එහි පෙර සැපසුම් කරන ලද කාර්යයන් වඩාත් කාර්යක්ෂම ලෙස ඉටුකරගැනීමට හැකිවූ අතර, මූල්‍යමය, තාක්ෂණික සහ පරිපාලන වශයෙන් පවතින ගැටළු ජයගැනීම සඳහා කඩිනමින් ක්‍රියාත්මක වී කළයුතු නව කාර්යයන් හඳුනාගෙන ඇත. එසේම, ජාතික වශයෙන් රටට වැඩි ආර්ථික ප්‍රතිලාභයක් ගෙන දෙන තෙල් හා ගෑස්

ගවේෂණ කටයුතු කෙරෙහි රජයේ මූලික අවධානය යොමු කළයුතු අතර මෙම ක්ෂේත්‍රයේ ආයෝජනය කිරීම කාලීන අවශ්‍යතාවයකි.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමිය, අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ අනෙකුත් නිළධාරීන්, ආයතන ප්‍රධානීන් ඇතුළු සියළු නිළධාරීන් සහ අධ්‍යක්ෂ මණ්ඩලවල නිළධාරීන් විසින් ඛනිජතෙල් ක්ෂේත්‍රයේ කාර්යසාධනය සැලකියයුතු මට්ටකට ගෙන ඒම සඳහා උපරිම සහයෝගය මා හට ලබාදෙනු ඇතැයි විශ්වාස කරමි.

**කබීර් හෂීම්, පා. ම.**
**මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ**
**ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය**

# ගරු ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමියගේ පණිවිඩය



ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී සභාගත කිරීම සඳහා සකස් කරන ලද මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අංශයේ ''කාර්යසාධන වාර්තාව 2018'' ප්‍රකාශනයට පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම සම්බන්ධයෙන් මා සතුටු වෙමි.

ආයතනික, මානව සම්පත් හා මූල්‍ය හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය සහ පොලිප්ටෝ ලංකා (පුද්) සමාගම යන ආයතනවල දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රමාද වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන ඇත. තවද 2015 වර්ෂයේ සිට විවිධාකාර අභියෝග මධ්‍යයේ වුවද, රටේ අඛණ්ඩ ඉන්ධන සැපයුම සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය එසේම ප්‍රමාද වී ඇති ව්‍යාපෘති සහ වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශයට හැකි වී තිබේ.

ඒ අනුව, ඉන්ධන ප්‍රවාහන නළ එළීම, ඉන්ධන ගබඩාකිරීමේ ටැංකි ඉදිකිරීම, ප්‍රාදේශියව පිහිටා ඇති ඛනිජ තෙල් ගබඩා ප්‍රතිසංස්කරණය කිරීම යනාදී යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම මඟිනුත් තෙල් ගවේෂණ සහ සංවර්ධන කටයුතු වේගවත් කිරීමට ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය මඟිනුත් ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් මත සිදුකර ඇත.

ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අංශය යටතේ ඇති ආයතන වන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය සමඟ එක්ව මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අංශය විසින් රටෙහි ජාතික සමාජ ආර්ථික සංවර්ධනය සඳහා දායක වී කටයුතු කිරීමට සැම විටම කැපවී සිටින බව අවධාරණය කිරීමට කැමැත්තෙමි.

**අනෝමා ගමගේ, පා.ම.**
**ඛනිජතෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය**



# පෙරවදන

මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අංශය ශ්‍රී ලංකාවේ පෙරගාමී, මධ්‍ය හා පසුගාමී ඛනිජ තෙල් කර්මාන්තයේ ප්‍රධාන ප්‍රතිපත්ති සම්පාදන ආයතනය වශයෙන් මෙම "කාර්යසාධන වාර්තාව 2018" නමැති ප්‍රකාශනය, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාව මගින් එවකට ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හා ඒ යටතේ පැවති ආයතන හතර වන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය සහ පොලිප්ටෝ ලංකා (පුද්) සමාගම 2018 ජනවාරි සිට දෙසැම්බර් මස දක්වා කාල සීමාව තුළ සිදුකළ කාර්යයන් හි සාරාංශයක් ඉදිරිපත් කරනු ලබයි.

ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මගින් උක්ත ආයතන හතරෙහි සහයෝගය ඇතිව අඛණ්ඩ ඉන්ධන සැපයුම සහතික කිරීම උදෙසා වැදගත්වන ප්‍රතිපත්තිමය තීරණ කිහිපයක් ගෙන ඇති බව මම සතුටින් සඳහන් කරමි. මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ නව ලේකම්වරයා වශයෙන් මුදල්, මානව සම්පත් සංවර්ධනය, ආයතන හා පාලන මූල්‍ය කටයුතු, විගණනය, නීති සම්පාදනය සහ සංවර්ධනය යන ක්ෂේත්‍රයන් තුළ ඵලදායී තීරණ කිහිපයක් මේ වන විටත් ගෙන ඇත. මෙහිදී උද්ගාමී සහ පසුගාමී ඛනිජ තෙල් කර්මාන්තයේ අභිවෘද්ධිය උදෙසා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනවල කටයුතු සම්බන්ධයෙන් මග පෙන්වීම සහ පහසුකම් සැලසීම කරනු ලබයි.

බලශක්ති කෙෂ්ත්‍රය සඳහා ස්වාභාවික වායු ද්‍රවීකෘත ස්වභාවික වායු හඳුන්වා දීම සම්බන්ධයෙන් රජයේ අවධානය යොමු වී ඇති බැවින් ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් හඳුන්වාදීම කාලීන අවශ්‍යතාවයක් වී ඇත. ඒ අනුව අමාත්‍යාංශය විසින් එකී ප්‍රතිපත්තිය සකස් කර ඇති අතර එය මහජන අදහස් ඇතුළත් කරමින් 2019 දෙවන කාර්තුව තුළ දී අවසන් කිරීමට නියමිතයි එසේම දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රමාද වී ඇති දේශීය තෙල් සහ ගෑස් සම්පත් ගවේෂණය සහ සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් සහ ඛනිජ තෙල් නිෂ්පාදන මිල දී ගැනීම ක්‍රමවත් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය මග පෙන්වීම කරනු ලබයි.

මීට අමතරව, රටේ ඉන්ධන සුරක්ෂිතතාව තහවුරු කිරීම පිණිස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉන්ධන ගබඩා කිරීමේ, බෙදාහැරීමේ සහ අලෙවි කිරීමේ කටයුතු සම්බන්ධයෙන් ඉතා සමීප අධීක්ෂණයක් සිදුකිරීම අවශ්‍ය වී ඇත. ගරු අමාත්‍යතුමාගේ සහ ගරු නියෝජ්‍ය අමාත්‍ය තුමියගේ උපදෙස්මත 2019 වර්ෂය සඳහා කාර්යයන් බොහොමයක් සැලසුම්කර ඇත. අනාගතයේ දී තිරසාරාත්මක ඉන්ධන සැපයුම තහවුරු කරනු වස් අමාත්‍යාංශයේ අරමුණු සාර්ථකව ළඟාකර ගැනීම උදෙසා අමාත්‍යාංශයේ සහ ආයතනවල කාර්ය මණ්ඩලයේ අඛණ්ඩ සහයෝගය ලබාදෙනු ඇතැයි අපේක්ෂා කරමි.

**සුනිල් හෙට්ටිආරච්චි**
**ලේකම්**
**මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ**
**ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

# හැඳින්වීම

ඛනිජතෙල් ක්ෂේත්‍රයේ පෙරහාග සහ පසුහාග කාර්යයන් සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා වෙනමම ආයතනයක් පැවතීම වැදගත් බැවින් අංක 1422/22 සහ 2005.12.08 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ඛනිජතෙල් සහ ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ස්ථාපිත කරන ලදී. ඉන්පසු අංක 1651/20 සහ 2010.04.30 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ඛනිජතෙල් ක්ෂේත්‍රයේ පසුහාග කාර්යයන්ට පමණක් වගකියන ආයතනයක් වශයෙන් ඛනිජතෙල් කර්මාන්ත අමාත්‍යාංශය පිහිටුවන ලද අතර පෙරහාග කාර්යයන් ඍජුවම අතිගරු ජනාධිපතිතුමාගේ අධීක්ෂණය යටතේ පැවතුණි. අංක 1897/15 සහ 2015.01.18 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ඛනිජතෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ කාර්යයන් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය යටතට පවරන ලදී. කෙසේවුවද, නැවතත් ඛනිජතෙල් ක්ෂේත්‍රයේ පෙරහාග සහ පසුහාග කාර්යයන් සඳහා වගකියන ආයතනයක් වශයෙන් අංක 1933/13 සහ 2015.09.21 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ස්ථාපිත කර ඇත. නැවතත් අංක 2013/33 සහ 2018.12.28 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ස්ථාපිත කරන ලදී.

වර්තමානයේ රටේ දියත් කර තිබෙන සීඝ්‍ර සංවර්ධන ක්‍රියාවලියත් සමග ඉන්ධන සඳහා වන ඉල්ලුමද වැඩි වී ඇත. පෙරහාග සහ පසුහාග ඛනිජතෙල් කර්මාන්තය රටේ සියළුම ආර්ථික සංවර්ධන අංශයන් සමඟ අන්තර් සම්බන්ධතාවක් පෙන්වනු ලබයි. එබැවින් රටේ බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කරනු වස් ඛනිජතෙල් ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම අවශ්‍ය වේ. ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය හා පොලිප්ටෝ ලංකා සමාගම යන ආයතනවල ප්‍රධාන ගණන් දීමේ නිලධාරී ලෙස ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය එම ආයතන හතර සමඟ එක්ව අදාල සියලු ප්‍රතිපත්ති, ක්‍රියාමාර්ග, නිර්දේශ සහ සංවර්ධන ව්‍යාපෘති නිර්මාණය කරමින් සහ ඒවා ක්‍රියාත්මක කරමින් අරමුණු සහ ඉලක්ක ළඟා කර ගැනීමට අවශ්‍ය කටයුතු කරනු ලබයි. කාර්යක්ෂම සහ ඵලදායී තීරණ ගැනීමෙහිලා ලේකම් සහ ගරු අමාත්‍යවරුන් දෙපළට සහය දැක්වීම සඳහා අතිරේක ලේකම්වරුන් තිදෙනෙකුගේ ප්‍රධානත්වයෙන් පරිපාලන, සංවර්ධන, ප්‍රසම්පාදන, මූල්‍ය සහ අභ්‍යන්තර විගණන වශයෙන් අංශ පහක් අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක වේ.

# මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

## ඛනිජතෙල් සම්පත් සංවර්ධන අංශය

### දැක්ම

"පෙරහාග සහ පසුහාග ඛනිජ තෙල් කර්මාන්තය ශ්‍රී ලංකාවේ ජාතික සමාජ ආර්ථිකයේ පෙර ගමන්කරුවා බවට පත් කිරීම."

### මෙහෙවර

"රටේ බලශක්ති අවශ්‍යතාව සපුරාලීම සඳහා අමාත්‍යාංශය යටතේ එන ආයතන නියාමනය, සම්බන්ධීකරණය සහ පහසුකම් සැපයීම මගින් ඛනිජ තෙල් කර්මාන්තයේ පෙරහාග සහ පසුහාග ක්‍රියාකාරකම් තිරසාරාත්මකව, කාර්යක්‍ෂමව හා ඵලදායීව කළමනාකරණය කිරීම සහ ඛනිජ තෙල් සම්පත් ප්‍රශස්ත අයුරින් උපයෝජනය කිරීම."




### අරමුණු

- වසර 2030 දී ශ්‍රී ලංකාව සමස්ත ඛනිජතෙල් නිෂ්පාදනය දේශීය ඉන්ධන සහ ස්වභාවික වායු බලශක්තියෙන් ස්වයංපෝෂිත රටක් බවට පත් කිරීම.
- 2030 වන විට රටේ ඛනිජතෙල් නිෂ්පාදන සඳහා වන ඉල්ලුම මෙරට පිරිපහදු කිරීම මගින් සපුරාලීම.
- 2023 වන විට පෙට්‍රල් සහ ඩීසල් සඳහා පිළිවෙළින් යූරෝ IV (EURO IV) ප්‍රමිතිය හඳුන්වාදීම තුලින් ඒවායේ ගුණාත්මක තත්වය උසස් කිරීම.
- ආරක්ෂිතව හා බොහෝ කාර්යක්ෂම ලෙස ඉන්ධන ගබඩා කිරීම හා බෙදාහැරීම.
- ඉන්ධන සැපයුමෙහි ගුණාත්මක තත්ත්වය හා විශ්වසනීයත්වය දියුණු කිරීම.
- ඛනිජතෙල් සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම.

# සංවිධාන ව්‍යුහය



ගරු අමාත්‍යතුමා
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමිය
ලේකම්
අතිරේක ලේකම් (පාලන) 01
අතිරේක ලේකම් (සංවර්ධන) 01
අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) 01
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) 01
ප්‍රධාන ගණකාධිකාරි 01
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන) 01
අධ්‍යක්ෂ (සැලසුම්) 01
අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) 01
ප්‍රධාන අභ්‍යන්තර විගණක 01
සහකාර ලේකම් (පාලන) 01
නීති නිලධාරි 01
ගණකාධිකාරි 01
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) 01
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) 01
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) 01
පරිපාලන නිලධාරි 01
භාෂා පරිවර්තක 01
ලේකම්ගේ සම්බන්ධිකරණ ලේකම් 01
රාජ්‍ය කළමනාකරණ සහකාර 27
සංවර්ධන සහකාර සංවර්ධන නිලධාරි 20
කාර්යාල කාර්ය සහායක 13
තොරතුරු තාක්‍ෂණ සහකාර 02
රියදුරු 13
නිශ්චල ඡායාරූප ශිල්පී
කැමරා සහායක 01
වීඩියෝ කැමරා ශිල්පී 01

## අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය 2018 දෙසැම්බර් 31 දිනට

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | |
| ලේකම් | 01 | 01 | - |
| අතිරේක ලේකම් | 03 | 02 | 01 |
| ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | - |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 02 | - | 02 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 01 | 01 | - |
| අධ්‍යක්ෂ | 02 | 02 | - |
| සහකාර ලේකම් | 02 | 01 | 01 |
| සහකාර අධ්‍යක්ෂ | 02 | 02 | - |
| ගණකාධිකාරී | 01 | - | 01 |
| නීති නිලධාරී | 01 | 01 | - |
| **එකතුව** | **16** | **11** | **05** |
| **ද්විතියික මට්ටම** | | | |
| පරිපාලන නිලධාරී | 01 | - | 01 |
| භාෂා පරිවර්තක | 01 | - | 01 |
| **එකතුව** | **02** | **-** | **02** |
| **තෘතියික මට්ටම** | | | |
| සංවර්ධන සහකාර / නිලධාරී | 20 | 13 | 07 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 27 | 24 | 03 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 02 | 02 | - |
| ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම් | 01 | - | 01 |
| නිශ්චල ඡායාරූප ශිල්පී | 01 | - | 01 |
| වීඩියෝ කැමරාකරු | 01 | - | 01 |
| **එකතුව** | **52** | **39** | **13** |
| **ප්‍රාථමික මට්ටම** | | | |
| රියදුරු | 13 | 12 | 01 |
| කැමරා සහායක | 01 | - | 01 |
| කාර්යාල කාර්ය සහායක | 13 | 10 | 03 |
| **එකතුව** | **27** | **22** | **05** |
| **මුළු එකතුව** | **97** | **72** | **25** |

# ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව

## දැක්ම

"ඛනිජතෙල් කර්මාන්ත ක්ෂේත්‍රයෙහි පාරිභෝගිකයා මුල් තැන ලබන්නා වූ ද පරිසරයට හිතවාදී වූ ද කලාපයේ ප්‍රමුඛ ව්‍යාපාරය බවට පත්වීම හා ජාතික සෞභාග්‍යය උදෙසා දායකත්වය සැපයීම"

## මෙහෙවර

"ඛනිජතෙල් පිරිපහදු කිරීම සහ උසස්ම තත්ත්වයේ නිෂ්පාදන අලෙවි කිරීම පිළිබඳව විශිෂ්ටත්වය කරා ළඟාවීමේ අභිලාශය මුදුන්පත් කරගැනීම සඳහා කැප වුණ එම ක්ෂේත්‍රයන්හි නිපුණතා ඇති වෘත්තිකයන් කණ්ඩායමක් හා පක්ෂපාතී, කාර්යක්ෂම බෙදාහරින්නන් ජාලයක මාර්ගයෙන් පාරිභෝගික අවශ්‍යතාවයන් ඉහළින්ම ඉටු කරන පූර්ණ විසඳුම් සහ සේවාවන් සැලසීම සම්බන්ධයෙන් විශිෂ්ටත්වය සාක්ෂාත් කරගැනීම මෙන්ම සේවක සහභාගිත්වය හා නවෝත්පාදක නැඹුරුව මගින් ව්‍යාපාරයේ සංවර්ධනය උදෙසා උසස්ම ආචාර ධර්මවලට අනුකූලව සෞඛ්‍යය, ආරක්ෂාව සහ පාරිසරික යන අංශ කෙරෙහි ඉහළින්ම සැලකිලිමත් වෙමින් ව්‍යාපාරික හවුල්කරුවන්ගේ අභිමතාර්ථයන් මුදුන්පත් කිරීම"




## අරමුණු

- ඉහළ වෙළඳපොළ කොටස්කරුවා වීම.
- ඉහළ තරගකාරී පරිසරයකට මුහුණදීම සඳහා විකුණුම්, අලෙවිකරණය හා මෙහෙයුම් යනාදී ක්ෂේත්‍රයන්හි අනර්ඝත්වයට පත්වීම.
- ආර්ථික වශයෙන් ලාභදායී පිරිපහදු ක්‍රියාවලියක් පවත්වා ගැනීම.
- සියළු සේවක මට්ටම්වල ඉහළ වෘත්තීයමය කුසලතාවක් වර්ධනය කිරීම හා පවත්වා ගැනීම.
- ඵලදායීතාව හා කළමනාකරණය වර්ධනය කිරීම සඳහා ව්‍යුහාත්මක වෙනස්කම් හඳුන්වා දීම.
- සෞඛ්‍ය සම්පන්න බව ආරක්ෂා වන පරිදි, ප්‍රවේශම් සහ ආරක්ෂාකාරී ක්‍රියාමාර්ග අනුගමනය කිරීම තුළින් පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල වන සේ පාරිසරික හිතවාදී ආයතනයක් බවට පත් කිරීම.
- ජනතාවගේ උන්නතිය උදෙසා ජාතික හා සමාජීය වගකීම් ඉටුකිරීම.
- සංස්ථාවේ මූල්‍යමය ශක්තිය තහවුරු කිරීම.
- දේශීය ඛනිජතෙල් පසුභාග ක්‍රියාවලියෙහි නායකත්වය පවත්වා ගැනීම.

# ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

## දැක්ම

දකුණු ආසියාවේ වඩාත් කාර්යක්ෂම ඛනිජතෙල් පර්යන්ත ක්‍රියාකරු වීම.

## මෙහෙවර

ගුණාත්මක බව රැකීම හා පර්යන්ත පහසුකම් පරිශීලකයන්ට නිකුත් කරන ඛනිජතෙල් නිෂ්පාදන ප්‍රමාණ පිළිබඳ නිශ්චිතව සහතික වන අතර දිවයිනේ පාර්ශවකරුවන් හමුවේ බලාපොරොත්තුවන වඩාත් කාර්යක්ෂම පර්යන්ත ක්‍රියාකරු ලෙස රැඳී සිටිමින් සෞඛ්‍ය, පාරිසරික, හා ආරක්ෂක ප්‍රමිතීන් තුළින් පක්ෂපාතීව ගෞරවාන්විත කැපවීමේ බලයෙන් එය පාරිභෝගික ප්‍රතිචාර සහ සාමාන්‍ය මහජනතාවට මනා පුහුණුව ලත් කාර්ය සාධක බලකායක් විසින් මග පෙන්වීම.




## අරමුණු

- වඩාත් කාර්යක්ෂම ඛනිජ තෙල් පර්යන්ත ක්‍රියාකරු බවට පත් වීම.
- ඉන්ධන තොග ගබඩා පහසුකම් වැඩි දියුණු කිරීම, එම නිෂ්පාදිතවල තත්ත්වය උසස් මට්ටමින් පවත්වා ගැනීම, දිවයින පුරා ඉල්ලුමට අනුකූලව ඉන්ධන තොග බෙදා හැරීම.
- ඛනිජතෙල් නිෂ්පාදනවල ගුණත්වය වැඩිදියුණු කිරීම තුළින් පාරිභෝගික තෘප්තිය වර්ධනය කිරීම සහ අඛණ්ඩ ඉන්ධන සැපයුමක් තහවුරු කිරීම.
- ප්‍රජාවගේ උන්නතිය සඳහා වන ජාතික සහ සමාජයීය වගකීම් ඉටු කිරීම.
- සෞඛ්‍ය සම්පන්න බව ආරක්ෂා වන පරිදි, ප්‍රවේශම් සහ ආරක්ෂාකාරී ක්‍රියාමාර්ග අනුගමනය කිරීම තුළින් පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල වන සේ පාරිසරික හිතවාදී ආයතනයක් බවට පත් කිරීම.
- ආයතනයේ සෑම මට්ටමකම සේවකයන්ගේ වෘත්තීයමය හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ එම හැකියාවන් උසස් අයුරින් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
- ආයතනයේ ඵලදායීතාවය වර්ධනය කිරීම සහ උසස් කළමනාකාරිත්වයකින් සමන්විත ආයතනයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය ව්‍යුහාත්මක පරිවර්තනයන් සිදු කිරීම.
- ආයතනයේ මූල්‍යමය ස්ථාවරභාවය පිළිබඳව සහතික වීම.

# ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය

## දැක්ම

රටේ ඛනිජතෙල් සම්පත් ප්‍රතිලාභ සියලු ශ්‍රී ලාංකිකයන්ට ලබා දීම තහවුරු වන පරිදි සාධාරණ, සුරක්ෂිතව හා පාරිසරික වශයෙන් හිතවාදීව තිරසාර ලෙස කර්මාන්තය කළමනාකරණය කිරීම සහතික වීම.

## මෙහෙවර

අවසාන ආර්ථික තෙල් සංචිත නිෂ්පාදනය දක්වා ආයෝජනය ආකර්ෂණය කර ගැනීමේ සහ දැනුම ගලායාම දිරිගැන්වීමේ අරමුණින් දේශීයව වේගයෙන් වර්ධනය වන ආර්ථික අපේක්ෂාව මුදුන්පත් වන පරිදිත් ස්ථාවර හා කාර්යක්ෂම නියාමන රාමුවක් නිර්මාණය වන පරිදිත් මූල්‍ය ප්‍රතිපත්තියක් සැලසුම්කිරීම සහ ක්‍රියාත්මක කිරීම.




## ප්‍රධාන අරමුණ

දේශීය තෙල් සහ ගෑස් ගවේෂණය සහ එතුළින් සමාජ-ආර්ථික සංවර්ධනයට මෙන්ම ජාතික බලශක්ති සුරක්ෂිතතාවට දායකවීම.

# 1. ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති

## (අ) ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සැකසීම

2011 වර්ෂයේ මන්නාරම් ද්‍රෝණියේ එම්2 ගවේෂණ බිම් කොටසේ දැනටමත් සොයාගෙන ඇති ස්වභාවික වායු නිධි සහ ශ්‍රී ලංකාවේ උතුරු-නැගෙනහිර සිදුකරගෙන යන තෙල් සහ වායු නිධි පිළිබඳ සංවර්ධන කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් දැනටමත් සොයාගෙන ඇති තෙල් සහ ගෑස් තවදුරටත් ගවේෂණය කිරීමේ සහ වාණිජකරණය කිරීමේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගෙන ඇත. දැනටමත් ගවේශණය කර ඇති ස්වභාවික වායු නිධි සංවර්ධනය කිරීමට සහ තවදුරටත් එහි තිබිය හැකි හයිඩ්‍රොකාබන් පිළිබඳ ගවේෂණය කිරීමටත් ජාත්‍යන්තර ලංසු කැඳවීමේ වටයක් පැවැත්වීමටත් සැලසුම්කර ඇත. මීට අමතරව, බහු සේවා දායක පදනම මත ඒකාබද්ධ අධ්‍යයනයන් තුළින් විදේශීය ආයෝජකයින් මඟින් තෙල් සහ ගෑස් ගවේෂණ කටයුතු සිදු කරමින් පවතී.

මෙහිදී තරමක් කුඩා පරිමාණයෙන් යුත් "ඩෝරාඩෝ" නිධියෙහි ස්වභාවික ගෑස් ඝණ අඩි බිලියන 350ක් පමණ පවතින බවට අනාවරණය වී ඇති අතර එමගින් මෙ.වො. 630ක ධාරිතාවයෙන් යුත් විදුලි බලාගාරයක් අවු.10 ක කාලයක් ක්‍රියාත්මක කිරීමට හැකියාව පවතී. තරමක විශාල "බැරකුඩා" නිධියෙහි ස්වභාවික වායු ඝණ අඩි ට්‍රිලියන 1.5 ඉක්මවන බවට අනාවරණය කරගෙන ඇති අතර එය තවදුරටත් ගවේෂණය කළ යුතු අතර ප්‍රශස්ත නිශ්පාදන ක්‍රියාවලියක් උදෙසා ඇගයීමට භාජනය කළ යුතුය.

ස්වභාවික වායු සුපිරිසිදු බලශක්ති මූලාශ්‍රයක් වශයෙන් වර්තමානය වන විට ලෝකය පුරා බොහොමයක් රටවල් විසින් භාවිතා කරනු ලබයි. බලශක්ති උත්පාදනය සඳහා මෙන්ම විවිධ භාවිතයන් හේතුවෙන් ස්වභාවික වායු ශ්‍රී ලංකාවේ ද වැදගත් ඉන්ධනයක් බවට පත්ව ඇත. එබැවින් විදුලිබල, කර්මාන්ත, ප්‍රවාහන, ගෘහාශ්‍රිත සහ වානිජ අංශයන් හි කටයුතු සඳහා ස්වභාවික වායු ඉන්ධනයක් හෝ අමුද්‍රව්‍යයක් වශයෙන් භාවිතා කිරීමේ විභවතාවක් පවතී. දේශීය ස්වභාවික වායු මගින් හෝ ආනයනික ද්‍රවීකෘත ස්වභාවික වායු මගින් මෙම ආංශික ස්වභාවික වායු අවශ්‍යතාව සපුරා ගැනීමට අපේක්ෂිත අතර එය, ස්වභාවික වායු සුලභතාවය, වෙළඳපොළ තත්ත්වයන් හා රටේ ප්‍රතිපත්තිය මත පදනම් වේ.

වර්තමානය වන විට ස්වභාවික වායු මූලික වශයෙන් විදුලිබල උත්පාදනය සඳහා භාවිතා කිරීම සම්බන්ධයෙන් රජයේ අවධානය යොමු වී ඇත. එසේම, කර්මාන්තකරුවන්, ප්‍රවාහනකරුවන් වැනි අනෙකුත් පාර්ශවයන් විසින් ඔවුන්ගේ අවශ්‍යතා වෙනුවෙන් ස්වභාවික වායු භාවිතා කිරීම සම්බන්ධයෙන් ඔවුන්ගේ උනන්දුව පිළිබඳව ද සාකච්ඡා කරමින් පවතී. මෙවැනි සන්දර්භයක් තුළ, කාලීන වශයෙන් ඉතා වැදගත් වන ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ මගපෙන්වීම මත ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සමඟ එක්වී ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය විසින් කෙටුම්පත් කර ඇත. සුරක්ෂිත නීතිරාමුවක් ආයොජකයින්ට ලබාදීමත් අනාගතයේ සොයා ගැනීමට නියමිත ස්වභාවික වායු සංචිත මූල්‍යකරණය කිරීමේ විවිධ මාර්ගයන් විවෘත කිරීම මෙම ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ වේ. මෙම කෙටුම්පත් ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම සඳහා ප්‍රධාන පාර්ශවකරුවන්ගේ වැඩමුළුවක් 2018 මැයි මාසයේ දී ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් පවත්වන ලදී. මෙම පාර්ශවකරුවන්ගේ රැස්වීමේ දී ඉදිරිපත් කරන ලද අදහස් ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය විසින් ප්‍රධාන ප්‍රතිපත්තියට

ඇතුළත් කර අමාත්‍යාංශය වෙත ඉදිරි කටයුතු සඳහා එවා ඇත. මෙහිදී කෙටුම්පත් ප්‍රතිපත්තිය සම්මත ආකෘතියකට අනුව සකස් කිරීමටත් රාජ්‍ය අංශයේ නියමිත අනුමත පරිපාටියට අනුව සැකසීමටත් අදාළ කටයුතු අමාත්‍යාංශය විසින් සිදු කරමින් පවතී.

### (ආ) ඛනිජතෙල් ප්‍රසම්පාදනය

ශ්‍රී ලංකාවට වැඩි ප්‍රමාණයක් ඛනිජතෙල් නිෂ්පාදන ආනයනය කරනු ලබන්නේ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව මගිනි. විශේෂ ස්ථාවර අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවක් සහ තාක්ෂණික ඇගයීම් කමිටුවක් මගින් ඇගයීම් කර ඉන්ධන ආනයනය කිරීම සම්බන්ධයෙන් සුපරීක්ෂාකාරී ක්‍රමවේදයක් ස්ථාපිත කර ඇත.

ඉන්ධන ආනයන මිල ලෝක වෙළඳපොළ මිල සහ තීරණය කරන ලද අධිභාරය යන සංරචක දෙක මත පදනම් වේ. සාමාන්‍යයෙන් අස්ථාවර ලෝක තෙල් වෙළඳපොළේ එක් වතාවක් සඳහා ඇනවුම්කර මිලදී ගැනීම්වල දී දීර්ඝ කාලීන මිලදී ගැනීම්වලට වඩා වැඩි අධිභාරයන් තීරණය වේ. ස්ථාවර අධිභාරයක් මත ඇතිවන වාසිය ලබා ගැනීමේ අරමුණින් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් මේ වන විට දිගුකාලීන ගිවිසුම් වෙත යොමු වී ඇත. එසේම බාධාවකින් තොරව ඛනිජතෙල් නිෂ්පාදන ලබා ගැනීමේ හැකියාව ද දීර්ඝ කාලීන ගිවිසුම් ගතවීමෙන් ලබා ඇති වාසියකි. මෙසේ ඉතා පරික්ෂාකාරීව සිදුකරන ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළින් රටෙහි අවශ්‍ය ප්‍රමාණයට තොග රැස් කර ගැනීමට හා එමගින් ඉන්ධන සුරක්ෂිතතාවය තහවුරු කර ගැනීමට හැකියාව ලැබී ඇත.

### (ඇ) බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි තෙල් සැපයුම් පද්ධතිය නවීකරණය සහ පුළුල් කිරීම සහ නව E-පර්යන්තයෙහි තෙල් සැපයුම් පද්ධතියක් ස්ථාපිත කිරීම.

අමාත්‍යාංශය සහ ලංකා ඛනිජතෙල් නිතිගත සංස්ථාව විසින් බණ්ඩාරනායක ගුවන්තොටුපොළ සංවර්ධන ව්‍යාපෘතියේ දෙවන පියවරෙහි දෙවන අදියරට සමාන්තරව ගුවන්යානා ඉන්ධන සැපයුම් පර්යන්තය හා නළ පද්ධතිය නවීකරණය හා පුළුල් කිරීමට අවශ්‍ය කටයුතු අරම්භ කර ඇත. අතිරේක ගබඩා පහසුකම් ඇති කිරීම සහ දැනට පවතින තෙල් සැපයුම් පද්ධතිය නවීකරණය හා පුළුල් කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචකයන් වේ. මෙම ව්‍යාපෘතිය අමාත්‍යාංශයේ මාර්ගෝපදේශ යටතේ ගුවන්තොටුපල සහ ගුවන්තොටුපල සේවා ආයතනය සමග එක්ව ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

2017.07.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම (EPC) මත සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම සඳහා ජාත්‍යන්තර තරගකාරි ලංසු කැඳවන ලදී. ඒ අනුව අඳළ කොන්ත්‍රාත්තුව ඇ.ඩො මිලියන 51.5ක පිරිවැයකට M/S WEC Engineers and Constructors pte Ltd iy China National Chmical Engineering Co.Ltd යන සමාගම් වෙත 2018 ජනවාරි මාසයේ දී පිරිනමා ඇත. මෙම ව්‍යාපෘතිය 2020 ජූලි මාසයේ දී අවසන් කිරීමට නියමිත අතර වර්තමානය වන විට ඊට අදාළ විස්තරාත්මක ඉංජිනේරු අධ්‍යයනය සිදුකරමින් පවතී.

### (ඈ) රට හරහා තෙල් නළ එළිමේ ව්‍යාපෘතිය

පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්, ගුවන් යානා ඉන්ධන සහ දැවි තෙල් ගොඩබිමට බෑම සඳහා කොළඹ වරායේ පිහිටි ඩොල්පින් ජැටිය භාවිතා කරනු ලබන අතර කොළඹ වරායේ සිට කොළොන්නාව තෙල් ගබඩා සංකීර්ණය වෙත මෙම ඛනිජ තෙල් රැගෙන ඒම සඳහා භාවිතා කරනුයේ අවු. 40-77ක් පමණ පැරණි නළ පද්ධතියකි. රටේ අනාගත අඛණ්ඩ

තෙල් සැපයුම තහවුරු කිරීම සඳහා මෙම නළ පද්ධතිය කඩිනමින් නවීකරණය කිරීම අත්‍යාවශ්‍ය වී ඇත. මෙම තෙල් නළ පද්ධතිය කොළඹ වරායේ සිට කොලොන්නාව තෙල් ගබඩා සංකීර්ණය දක්වා තෙල් ප්‍රවාහනය සඳහා 1940 ගණන්වල ඉදි කරන ලද්දකි. පැල්පත් වාසීන් නීති විරෝධී ලෙස නළ පද්ධති පිහිටා ඇති රක්ෂිත ඉඩම් තුළ පදිංචි වීම මත එම නළවල නඩත්තු කටයුතු හා පිළිසකර කිරීම් සිදු කිරීමට නොහැකි වීම හේතුවෙන් තෙල් නළ මාර්ග දෙකක් මීට වසර ගණනකට පෙර භාවිතයෙන් ඉවත් කර ඇත.

1969 දී සපුගස්කන්ද තෙල් පිරිපහදුව ආරම්භ කිරීමත් සමඟ තවත් නළ මාර්ග දෙකක් ඉදි කරන ලදී. ඛනිජතෙල් ප්‍රවාහන නළ මාර්ගවල අපේක්ෂිත ජීවන කාලය අවු. 25ක් පමණ වුවද, අවු. 77ක් සහ අවු. 43ක් පැරණි නළ මාර්ග හරහා තවමත් ආනයනික පිරිපහදු තෙල් සහ බොරතෙල් ප්‍රවාහනය කරනු ලැබේ.

රටේ ඛනිජතෙල් අවශ්‍යතාවයෙන් විශාල ප්‍රමාණයක් මෙම අබලන් වූ නළ මාර්ග ඔස්සේ කොලොන්නාව තෙල් ගබඩා සංකීර්ණය වෙත රැගෙන යන හෙයින් මෙම නළ මාර්ග නවීකරණය කිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත.

**අපේක්ෂිත ප්‍රතිලාභ**

- ජාතික ඛනිජතෙල් අවශ්‍යතාව සපුරාලීම
- කොළඹ වරායේ සිට කොලොන්නාව දක්වා ඛනිජතෙල් ප්‍රවාහනය කාර්යක්ෂමව සිදු කිරීම.
- ඛනිජතෙල් නිමි භාණ්ඩයක් ලෙස පාරිභෝගිකයා වෙත ළඟා වන තුරු ඒවායේ ගුණාත්මක භාවය පවත්වා ගැනීම.
- අනාගත වැඩි වන ඉල්ලුම සපුරාලීමට හැකියාව ලැබීම සහ අඛණ්ඩව සේවාව තහවුරු කිරීම.
- ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව හා ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට සිදු වන තොග හීන වීමේ පාඩු සහ මූල්‍ය පාඩු අවම වීම.
- අබලන්ව ඇති නළ මාර්ග නඩත්තු කිරීමේ පිරිවැය අවම වීම.

ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය සම්බන්ධව ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව හා ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කරනු ලබයි. මේ වන විට ඒ සඳහා අවශ්‍ය මූලික පියවරයන්, එනම් භූමි ලක්ෂණ සමීක්ෂණය, භූගෝලීය සමීක්ෂණය, මූලික පාරිසරික පරීක්ෂණය, වඩාත් යෝග්‍ය නළ එළීමේ මාර්ග හඳුනා ගැනීම, ඉන්ධන ප්‍රවාහන නළ මාර්ග අවට අනවසර නිවෙස්වල පදිංචිව සිටි පවුල්වලින් කොටසක් නැවත පදිංචි කිරීමට අදාල වන්දි ගෙවීම ආදී කටයුතු අවසන් කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයා ගැනීමේ කටයුතු සහ වඩාත් සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. මෙම අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාමාර්ග සහ ප්‍රතිපත්තිමය තීරණ කිහිපයක් ගෙන ඇත.

2015.12.24 දිනැති ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි දැනට පවත්නා නළ මාර්ගවලට යාබදව දුම්රිය රක්ෂිතය ඔස්සේ 14" විශ්කම්භයකින් යුත් එක් නව piggable නළ මාර්ගයක් හා 18" විශ්කම්භයකින් යුත් එක් නව piggable නළ මාර්ගයක් ඉදි කිරීම සහ අක් වෙරළ, ඩොල්ෆින් ජැටිය හා ඔරුගොඩවත්ත ප්‍රධාන දුම්රිය හරස් මාර්ගයේ දැනට තිබෙන 12" විෂ්කම්භයෙන් යුත් නළ මාර්ගයේ ඛණ්ඩ තුන නැවත එළීම යන කාර්යයන්ගෙන් සමන්විත වන ලෙස සමස්ත ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් කරන ලද අතර එය ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම (EPC) කොන්ත්‍රාත්තු ක්‍රමයට ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී.

ඉහත තීරණය මත පදනම්ව අංක 16/0785/746/002-1 සහ 2016-04-28 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව සම්පූර්ණ ව්‍යාපෘතියම ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් කටයුතු කොන්ත්‍රාත්කරු විසින්ම සිදු කිරීමේ පදනම මත සියයට සියයක්ම මූල්‍යනය වන, රජයෙන් රජයට ප්‍රසම්පාදන ක්‍රමවේදය මත අදාළ තානාපති කාර්යාලය/මහ කොමසාරිස් කාර්යාලය මගින් නිර්දේශ කරන එක් පරිපූර්ණ යෝජනාවක් පමණක් අදාළ රටවලින් එනම් ඇමෙරිකානු එක්සත් ජනපදය, මහජන චීන ජනරජය, ඉන්දියානු ජනරජය හා මැලේසියානු රජයෙන් කැඳවීම සඳහා 2016-05-10 දින අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දෙන ලදී. ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති අතර ඉහත සඳහන් කරන ලද රටවල් 4න් ලැබුණු යෝජනා ඇගයීම් කරමින් පවතී.

### (ඉ) මුතුරාජවෙල සිට බණ්ඩාරනායක ගුවන්තොටුපල දක්වා ගුවන් යානා ඉන්ධන සැපයීමේ නළපද්ධතිය ඉදිකිරීම.

බණ්ඩාරනායක ගුවන්තොටුපොළෙහි පවත්නා තෙල් සැපයුම් පහසුකම් සම්බන්ධයෙන් පැන නැගී ඇති ඉන්ධවල ගුණාත්මකභාවය පිළිබඳ ගැටළු මගහරවා ගැනීමටත්, වැඩිවන ගුවන් යානා ඉන්ධන ඉල්ලුම සපුරාලීමටත්, මෙම ගුවන් යානා ඉන්ධන සඳහා තරගකාරී මිලක් ලබා දීමටත් හැකිවන පරිදි දැනට පවතින දුෂ්කරතා ඉවත් කරමින් නව ගුවන් යානා ඉන්ධන ප්‍රවාහන නළ පද්ධතියක් මුතුරාජවෙල සිට ඉදි කිරීමට තීරණය කර ඇත. දැනට සිදු කෙරෙන බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රතිඵලයක් වශයෙන් ගුවන් යානා ඉන්ධන ඉල්ලුමෙහි වැඩිවීමක් අපේක්ෂා කරනු ලබයි. ඉන්ධන නළය ඉදිකිරීම සඳහා යෝජිත මාර්ගය සම්බන්ධයෙන් පැවති ගැටළුකාරී තත්ත්වය හේතුවෙන් ඒ සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද වී ඇත. මෙම කොළඹ - කටුණායක අධිවේගී මාර්ගයට සමාන්තරව මෙම නළය එළීමට අවසර ඉල්ලුවද ඊට ද අනුමැතිය ලබා දී නොමැත. ඒ අනුව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දැනට අනුමත කර ඇති පරිදි, යෝජිත නළය මහජන කාර්යයන්ගෙන් පිරි මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය (A3 road, B152 road & B425 road)" මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග නුගපේ (බෝපිටිය පාර) සහ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සංස්ථාවට අයත් ඉඩම හරහා ඉදිකිරීමට නියමිතය.

### (ඊ) ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි සංකීර්ණයේ ඉහළ කොටසේ සංවර්ධනය

ත්‍රිකුණාමලයේ පිහිටි ටැංකි සංකීර්ණය සුදු යකඩ පාස්සන ලද ගබඩා ටැංකි 99න් සමන්විත වේ. බ්‍රිතාන්‍ය රජය විසින් 1930 ගණන්වල අග භාගයේ දී මෙම ටැංකි සංකීර්ණය ඉදිකර ඇති අතර සෑම ටැංකියක්ම ඝන මීටර 12,500 කින් සමන්විත ටැංකි 102 මූලිකව පැවතී ඇත. වර්තමානයේ දී ලංකා ඉන්දියානු තෙල් සමාගම විසින් පහළ කොටසේ පිහිටා ඇති ටැංකි 14ක් මෙම සමාගමේ තෙල් මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරනු ලබන අතර විවිධ හේතූන් මත භාවිතයෙන් තොරව ටැංකි 85ක් ඉහළ කොටසේ පවතී. 2017 අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර අත්සන් කරනු ලැබූ අවබෝධතා ගිවිසුම අනුව ඉන්දියාව සමඟ ඒකාබද්ධව මෙම ටැංකි සංකීර්ණය සංවර්ධනය කිරීමට යෝජනා කර ඇත. මේ වන විට එය සාකච්ඡා මට්ටමේ පවතී.

### (උ) ලිහිසිතෙල් මිශ්‍ර කිරීමේ කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය

ඉතා සාර්ථක ලෙස ලිහිසිතෙල් ව්‍යාපාර කටයුතුවල නිරත වන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වර්තමානය වන විට 11% ක වෙළඳපොළ කොටසක් අත්පත් කරගෙන

ඇත. දේශීය ලිහිසිතෙල් වෙළඳපොළේ ප්‍රධාන තරඟකරුවන් ත්‍රිත්වයෙන් එක් පාර්ශවයක් වන්නේ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවයි. චෙව්රෝන් සිලොන් සමාගම සහ ලංකා ඉන්දියන් ඔයිල් සමාගම යන ඉහළ පෙළේ සමාගම් ද්විත්වයම ඔවුන්ගේ වෙළඳපොළ කොටස අත්පත් කරගෙන ඇත්තේ දේශීයව පවත්නා ලිහිසිතෙල් නිෂ්පාදන කර්මාන්ත ශාලා හරහා සියළු නිෂ්පාදන ප්‍රතිලාභ ද සමගිනි. කෙසේ වුව ද ආනයනික ලිහිසිතෙල් නිෂ්පාදන අලෙවි කිරීමෙන් පමණක් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව ලිහිසිතෙල් වෙළඳපොළේ තෙවන ස්ථානය කරා ළඟා වීමට සමත් වී ඇත. ලිහිසිතෙල් ව්‍යාපාරයේ සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම වන රුපියල් බිලියන 2.5 ක ප්‍රමාණය ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ලිහිසිතෙල් ව්‍යාපාරයේ මුළු පිරිවැටුමෙන් 0.5% ක ප්‍රතිශතයක් වන බැවින් මෙය සංස්ථාවට විකල්ප ප්‍රතිලාභ සපයන ආයෝජන අවස්ථාවක් ලෙස සැලකිය හැකිය.

ඉහත දක්වා ඇති පරිදි අමාත්‍යාංශයේ මඟපෙන්වීම යටතේ ශ්‍රී ලංකාවේ අපනයන වෙළඳපොළට හා දේශීය වෙළඳපොළට ලිහිසි තෙල් සැපයීමේ අරමුණින් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් මැලේසියාවේ හයිරැක්ස් ඔයිල් එස් ඩී එන් බී එච් ඩී සමාගම හා එක්ව ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ පැවරීම (BOT) මාදිලිය යටතේ උසස් නවීණ තාක්ෂණයෙන් යුතු ලිහිසිතෙල් මිශ්‍ර කිරීමේ කර්මාන්ත ශාලාවක් මුතුරාජවෙළ ස්ථාපිත කිරීමට පියවර ගෙන ඇත. ඒ අනුව පාරිභෝගිකයන්ට බාධාවකින් තොරව අඛණ්ඩව ලිහිසිතෙල් සැපයීම තහවුරු කිරීම සඳහා මෙම ලිහිසිතෙල් මිශ්‍ර කිරීමේ කර්මාන්ත ශාලාව වාර්ෂිකව දළ වශයෙන් මෙ.ටොන් 72,000ක මුළු නිෂ්පාදන ධාරිතාවයකින් සමන්විත වන පරිදි ඉදිකිරීමට සැලසුම් කොට ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා වන පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 13ක් ලෙසට තක්සේරු කර ඇති අතර කොන්ත්‍රාත්කරු විසින් එම මුළු ආයෝජනය සිදු කිරීමට නියමිතය.

මෙවැනි ලිහිසි තෙල් මිශ්‍ර කිරිමේ කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීම තුලින් ලිහිසි තෙල්වල දේශීය මිල ගණන් අඩු කර ගැනිමට හැකියාව ලැබෙනු ඇත. මීට අමතරව වෙළඳපොළ කොටස ඉහළ යෑම තුලින් සංස්ථාවේ ලාභදායීත්වය ඉහළ යෑම, විදේශ සෘජු ආයෝජන, සංස්ථාවේ සහය සේවා වැඩි දියුණු වීම සහ වෙළඳපොළ නියෝජිත ජාලය ශක්තිමත් කිරිම, රැකියා අවස්ථා ජනිත වීම, විදේශ විනිමය ඉතිරි කර ගැනීම, තාක්ෂණික පුහුණුව හා තාක්ෂණය හුවමාරු කර ගැනීම, අපනයන වෙළඳපොළ අත්පත් කර ගැනීමට හැකි වීම, තොග පවත්වා ගැනීමේ දි පිරිවැයකින් තොරව ගුණාත්මක බවින් ඉහළ ලිහිසි තෙල් අඛණ්ඩව සැපයිම තහවුරු වීම, අනෙකුත් කර්මාන්ත ස්ථාපිත කිරීම ප්‍රවර්ධනය සහ පාරිභෝගිකයන්ට සංස්ථාව විසින් ලබා දෙන සහනාධාර වෙනුවෙන් දැරීමට සිදුවන පිරිවැය ආවරණය කර ගැනීමට හැකිවීම යනාදී ප්‍රතිලාභ රාශියක් මෙම ලිහිසි තෙල් මිශ්‍ර කිරීමේ කර්මාන්ත ශාලාව මෙරට ස්ථාපිත කිරීම තුලින් ළඟා කරගැනීමට හැකියාව ලැබේ.

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ මැලේසියානු හයිරැක්ස් ඔයිල් එස් ඩී එන්බී එච් ඩීසමාගම අදාල ගිවිසුම් 2016.05.06 වන දින අත්සන් කළ අතර ඒ අනුව,කර්මාන්ත ශාලාව ඉදි කිරීම් කටයුතු ආරම්භ කරන ලදී. මෙහි ඉදිකිරීම් කටයුතු නිමකිරීමට හා පරීක්ෂා කර බැලීමට හැකිවන පරිදි ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කරන ලදී.

කෙසේ වුවද ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ කළමනාකාරීත්වය වෙනස් වීමත් සමඟ ව්‍යාපෘතිය පිළිබඳ අධ්‍යයනය කිරීමට අවශ්‍ය වූ බැවින් පරීක්ෂා කිරීමේ කටයුතු ප්‍රමාද වී ඇත.

### (ඌ) අභ්‍යන්තර පාවෙන වහලය සහිත ඝන මීටර 15,000 ක ගබඩා ටැංකියක් කොලොන්නාව නිමාව තුළ ඉදිකිරීම හා ක්‍රියාත්මක කිරීම

ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාග මේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2015.04.07 දින 10/140 යටතේ ඉහත ව්‍යාපෘතිය සඳහා දී ඇත. රටෙහි ඉන්ධන අවශ්‍යතාවයන් සහතික කිරීම සඳහා ආනයන භාණ්ඩ හා පිරිපහදු නිෂ්පාදනවලට ප්‍රමාණවත් ගබඩා ධාරිතාවයක් පවත්වා ගැනීම මෙහි මූලික අරමුණ වේ.

ඉංජිනේරු ඇස්තමේන්තුගත වියදම රුපියල් මිලියන 495ක් වන අතර, ව්‍යාපෘති කාලසීමාව මාස 18 කි. මෙම සන්දර්භය තුළ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාල වැඩ කටයුතු කිරීමට තාක්ෂණික ඇගැයීම් කමිටුවක් පත් කර ඇත. අමාත්‍ය මණ්ඩලයෙන් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව මගින් තාක්ෂණික ඇගැයීම් කමිටුව අනුමත කරන ලද ටෙන්ඩර් පත ලංසු ඇගැයීම් සඳහා අනුමත කරන ලදි.

ඒ අනුව ජාත්‍යන්තර තරගකාරි ලංසු ක්‍රමවේදය යටතේ කැඳවන ලද මහජන ලංසු 2017.01.17 දින විවෘත කරන ලදි. ආයතන 7 කින් ලැබුණු ලංසු තාක්ෂණික කමිටු ඇගැයීමකට ලක්කොට සැලකිය යුතු ප්‍රතිචාර දක්වන ලද අඩුම ලංසුව ඉදිරිපත් කළ ඉන්දු ඊස්ට් ඉංජිනේරු කන්ස්ට්‍රක්ෂන් (ලංකා) ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයට රුපියල් 412,781,699.68 + බදු මුදලක් යටතේ අමාත්‍ය මණ්ඩලය මගින් පත් කරන ලද ප්‍රසම්පදාන කමිටු හා අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ පිරිනමනු ලැබීය. ඉදිකිරීම් කටයුතු 2017.12.19 දින ආරම්භ කරන ලද අතර 2019.06.19 දිනට ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතය. දැනට ව්‍යාපෘතියෙන් 65% ක් පමණ කොටසක් නිම කර ඇත.

### (එ) ඝන මීටර 5,000 ක ගබඩා ටැංකි 01ක්, ඝන, මීටර් 7,000 ගබඩා ටැංකි 02ක් සහ ඝන මීටර් 15,000 ක ගබඩා ටැංකි 03ක් කොලොන්නාව නිමාව තුළ ඉදිකිරීම

ශ්‍රී ලංකාවේ වාර්ෂික ඉන්ධන ඉල්ලුම 4-5% වර්ධන වේගයක් පෙන්නුම් කරයි. ඒ අනුව ප්‍රධාන ඉන්ධන ගබඩා දෙකෙහි අවම වශයෙන් එක් එක් ඉන්ධන වර්ගයන් සඳහා දින 30කට වත් ප්‍රමාණවත් වූ ඉන්ධන ගබඩා පහසුකම් තිබිය යුතුය. එබැවින් රටෙහි ඉන්ධන අවශ්‍යතාවයන් සහතික කිරීම සඳහා ආනයන භාණ්ඩ හා පිරිපහදු නිෂ්පාදනවලට අමතර මෙට්‍රික් ටොන් 100,000 ගබඩා ධාරිතාවයක් සැපයීම අනිවාර්යයෙන් කළයුතු අවශ්‍යතාවයක් වේ.

මෙම කාර්යයේ පළමු අදියර ලෙස 2017 දෙසැම්බර් මාසයේ දී ඝන මීටර් 15,000ක ගබඩා ටැංකියක් ඉදිකිරීම ආරම්භ කරන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා වූ ඇස්තමේන්තුගත වියදම රුපියල් මිලියන 412ක් වන අතර, ව්‍යාපෘති කාලසීමාව මාස 18 කි.

මෙම කාර්යයෙහි දෙවන අදියර ලෙස මුළු ධාරිතාවය ඝන මීටර් 64,000ක් වන්නා වූ ටැංකි හයක් ඉදිකිරීමට ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම තීරණය කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා වූ ඉංජිනේරු ඇස්තමේන්තුගත වියදම රුපියල් මිලියන 2,225ක් වන අතර, ව්‍යාපෘති කාලසීමාව මාස 40 කි.

මෙම සන්දර්භය තුළ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාල වැඩ කටයුතු කිරීමට තාක්ෂණික ඇගැයීම් කමිටුවක් සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවක් පත් කර ඇත. ඒ අනුව ජාත්‍යන්තර තරගකාරි ලංසු ක්‍රමවේදය යටතේ කැඳවන ලද මහජන ලංසු 2018.07.31 වනදින විවෘත කරන ලදි. ආයතන 12කින් ලංසු ඉදිරිපත් කරන ලදි. 2018.10.26 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන

ලද ප්‍රසම්පාදන කමිටුව රැස් වුන අතර, සැලකිය යුතු ප්‍රතිචාර දක්වන ලද අඩුම ලංසුව ඉදිරිපත් කළ ආයතනය සමග සාකච්ඡා කිරීමට තීරණය කරන ලදි. ඉදිරි ප්‍රසම්පාදන කටයුතු කිරීම සඳහා නැවත ප්‍රසම්පාදන කමිටුවක් පත් කරගත යුතුව ඇත.

මෙම ව්‍යාපෘතියේ ඉදි කිරීමේ කටයුතු 2019 මාර්තු මස ආරම්භ කිරීමට නියමිත අතර 2022 අගෝස්තු මස අවසන් කිරීමට නියමිතය.

### යූරෝ 4 තත්ත්වයේ ඉන්ධන හඳුන්වාදීම

ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් මත ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සුපිරි ඩීසල් සහ ඔක්ටේන් 95 පෙට්‍රල් වෙනුවට යූරෝ 4 තත්ත්වයේ සුපිරි ඩීසල් සහ ඔක්ටේන් 95 පෙට්‍රල් 2018 ජූලි 2 වන දින සිට වෙළඳපොළට හඳුන්වා දෙන ලදී. ධාවනයට යොදවන වාහන සංඛ්‍යාව වැඩිවීම සහ වාහන තදබදය ඉහළයාම හේතුවෙන් වර්ෂ ගණනාවක් තිස්සේ පවතින වායු දූෂණය අවම කිරීම සඳහා මෙය දායකත්වය සපයනු ලබයි. යූරෝ 4 යනු යුරෝපීය සංගමය විසින් වාහන සඳහා පිළිගත් වායු විමෝචන ප්‍රමිතිය වන අතර එහිදී ඉන්ධන වල අඩංගුවන සල්ෆර් ප්‍රමාණය සහ ටොක්සික් ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පවතින ඉන්ධන භාවිතා කළ යුතුය. යූරෝ 4 තත්ත්වයේ සහ භාරත් ප්‍රමිති සහතික දෙවන අදියරේ තත්ත්වයන් ගෙන් යුත් ඉන්ධන (Bharat Stage 4 standards) පමණක් භාවිතා කරනු ලබන වාහන ආනයනය කිරීම පාලනය කිරීම සඳහා වූ ප්‍රතිපත්තිමය තීරණයට සමගාමීව මෙම යූරෝ 4 තත්ත්වයේ ඉන්ධන හඳුන්වා දීම සිදුකරන ලදී. යූරෝ 4 ඉන්ධන භාවිතා කළයුතු වාහන ඉන්ධන දහනයේදී වඩාත් කාර්යක්ෂමතාවයෙන් යුක්ත වන අතර ඒවායෙහි දියුණු තික්ෂණ උපාංග සඳහා ද යූරෝ 4 තත්ත්වයේ ඉන්ධන භාවිතා කිරීම අවශ්‍ය වේ. යූරෝ 4 තත්ත්වයේ ඉන්ධන භාවිතයෙන් පරිසර දූෂණය අවම කරනු ලැබීම පමණක් නොව එමගින් පාරිභෝගිකයාට ආර්ථික වාසියක් ද සලසනු ලබයි. එසේම, අභ්‍යන්තරික වශයෙන් තැන්පත් වන කොටස් අවම කිරීම සහ පිරිසිදු කිරීම තුළින් උපරිම එන්ජින් කාර්යසාධනය පවත්වාගෙන යාමට ද ඉවහල් වේ.

# 2 ඛනිජතෙල් නිෂ්පාදන ආනයනය කිරීම

ඛනිජතෙල් නිෂ්පාදන ආනයනය කිරීම හා බෙදාහැරීම තුලින් රටේ සංවර්ධනය සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වැදගත් දායකත්වයක් සපයනු ලබයි. සේවාදායකයින්ගේ තෘප්තිය වැඩි දියුණු කිරීම උදෙසා ගුණාත්මක භාවයෙන් යුත් හා නවීන මාදිලියේ නිෂ්පාදන ආනයනය කිරීමට ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සැමවිටම වගබලා ගනී. 2016 සිට 2018 දක්වා ආනයනය කරන ලද පිරිපහදු කළ ඛනිජතෙල් නිෂ්පාදනවල විස්තර 2.1 වගුවේ දැක්වේ.

**2.1 වගුව** ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් ආනයනය කරන ලද පිරිපහදු ඛනිජතෙල් නිෂ්පාදන 2016 -2018

| නිෂ්පාදන | 2016 | | 2017 | | 2018 | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | | ප්‍රමාණය | | ප්‍රමාණය | |
| | බැරල් '000 | මෙ.ටො. '000 | බැරල් '000 | මෙ.ටො. '000 | බැරල් '000 | මෙ.ටො. '000 |
| ඔටෝ ඩීසල් | 9,070 | 1,213 | 10,560 | 1,416 | 8,793 | 1,178 |
| සුපර් ඩීසල් | 493 | 65 | 493 | 65 | 690 | 91 |
| පෙට්‍රල් - 92 ඔක්ටේන් | 5,394 | 634 | 6,361 | 746 | 6,581 | 769 |
| පෙට්‍රල් - 95 ඔක්ටේන් | 931 | 110 | 1,204 | 146 | 1,179 | 139 |
| ජෙට් A-1 | 2,671 | 337 | 2,235 | 282 | 3,656 | 461 |
| අඩු සල්ෆර් ඉන්ධන තෙල් (180 CST) | 1,131 | 173 | 2,039 | 313 | 1,864 | 285 |
| වැඩි සල්ෆර් ඉන්ධන තෙල් (180 CST) | - | - | - | - | 136 | 21 |

2014 සිට 2018 අග කාලය තුළපෙට්‍රල්, ඩීසල් සහ ජෙට් ඒ -1 ඛනිජතෙල් නිෂ්පාදනවල ආනයනයේ ප්‍රවනතාව පහත 2.1 ප්‍රස්තාරයෙන් පෙන්වයි. එමගින් 2014 - 2018 කාලය තුළ ශ්‍රී ලංකා වෙ වෙළඳපොළෙහි ඉහත කී නිෂ්පාදනවල අලෙවිය සැලකියයුතු ලෙස වර්ධනය වී ඇති බවක් පෙන්වයි.

**2.1 ප්‍රස්ථාරය** ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් ආනයනය කරන ලද පෙට්‍රල්, ඩීසල් සහ ජෙට් ඒ-1 2014 - 2018



2013 සිට 2018 අග දක්වා බොර තෙල් ආනයන පහත 2.2 වගුව මඟින් පෙන්වයි.

2.2 වගුව — බොර තෙල් ආනයනය 2013 - 2018

| වර්ෂය | ප්‍රමාණය (මෙටො'000) | ආනයන වටිනාකම (CIF) රු මිලියන |
|---|---|---|
| 2013 | 1,743 | 182,064 |
| 2014 | 1,824 | 187,760 |
| 2015 | 1,773 | 100,578 |
| 2016 | 1,685 | 87,198 (DES) |
| 2017 | 1,499 | 100,911 (DES) |
| 2018 | 1,763 | 160,933 (DAP) |

2019 වසර වෙනුවෙන් ඛනිජතෙල් නිෂ්පාදන සඳහා වූ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ඉල්ලුම් පුරෝකථනයේ විස්තර පහත 2.3 වගුව මඟින් පෙන්වයි. 2019 වසරේ ඉහළම ඉල්ලුම සහිත නිෂ්පාදනය වශයෙන් (ප්‍රමාණය අනුව) ලංකා ඔටෝ ඩීසල් පෙන්වා ඇත.

2.3 වගුව — ඛනිජතෙල් නිෂ්පාදන සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ඉල්ලුම් පුරෝකථනය - 2019 මෙ.ටො.'000

| නිෂ්පාදනයේ නම | සමස්ත අලෙවි පුරෝකථනය | පිරිපහදු නිෂ්පාදනය | ආනයනය කළ යුතු ප්‍රමාණය |
|---|---|---|---|
| පෙට්‍රල් 92 ඔක්ටේන් | 1,186.54 | 180.50 | 1,006.04 |
| පෙට්‍රල් 95 ඔක්ටේන් | 223.03 | - | 223.03 |
| ලංකා ඔටෝ ඩීසල් | 1,637.59 | 570.90 | 1,066.69 |
| ලංකා සුපර්ඩීසල් 4 ස්ටාර් | 97.31 | - | 97.31 |
| දැවි තෙල් | 802.99 | 553.39 | 249.60 |
| නැප්තා | 164.80 | 130.60 | 34.20 |
| ජෙට් ඒ-1 | 643.61 | 250.43 | 393.18 |
| කර්මාන්තීය භූමිතෙල් | 4.39 | - | 4.39 |
| තාර | 37.67 | 34.02 | 3.65 |
| ඔස් බී පී /සොල්වන්ට්ස් | 1.12 | 1.05 | 0.07 |
| භූමිතෙල් | 198.09 | 62.61 | 135.48 |
| එල්පීජී | 21.11 | 21.11 | - |

## 2.4 වගුව  බනිජතෙල් නිෂ්පාදන සඳහා පනවා ඇති රජයේ බදු 2018/12/31 දිනට

| නිෂ්පාදනය | එච්.එස් කේතය | මුළු රේගු ආනයන බද්ද | නිදහස් කළ රේගු ආනයන බද්ද | රේගු ආනයන බද්ද | සුරා බදු | වරාය හා ගුවන් සේවා බද්ද |
|---|---|---|---|---|---|---|
| **ඩීසල් (0.05%)** | 2710.19.42 | 5.85 | ලීටරයකට නිදහස් කළ බද්ද රු.5 | රු. 0.85 (ලීටරයකට) | රු. 6 (ලීටරයකට) | 7.5% (ඉන්වොයිසි වටිනාකම) |
| **ඩීසල් (10)** | 2710.19.41 | 10.55 | නැත | රු. 10.55 (ලීටරයකට) | රු.13 (ලීටරයකට) | 7.5% (ඉන්වොයිසි වටිනාකම) |
| **පෙට්‍රල් 92** | 2710.12.21 | 35 | ලීටරයකට රු.20 | රු. 15 (ලීටරයකට) | රු.27 (ලීටරයකට) | 7.5% (ඉන්වොයිසි වටිනාකම) |
| **ඔක්ටේන් 95** | 2710.12.22 | 35 | නැත | රු. 35 (ලීටරයකට) | රු.27 (ලීටරයකට) | 7.5% (ඉන්වොයිසි වටිනාකම) |
| **ජෙට් ඒ-1** | 2710.19.20 | නැත | නැත | නැත | නැත | 0 % |
| **දැවි තෙල්** | 2710.19.60 | නැත | නැත | නැත | නැත | 7.5% (ඉන්වොයිසි වටිනාකම) |
| **බොර තෙල්** | 2710.19.22 | නැත | නැත | නැත | රු.27 (ලීටරයකට) | 7.5% (ඉන්වොයිසි වටිනාකම) |

# 3. ඛනිජතෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදාහැරීම

## 3.1 ඉන්ධන ගබඩා කිරීම

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සතුව ප්‍රධාන පර්යන්තයන් දෙකක් කොලොන්නාව සහ මුතුරාජවෙල පිහිටුවා ඇති අතර තොග ගබඩා 11ක් දිවයින පුරා පිහිටුවා ඇත. එම තොග ගබඩා විසින් සිදු කරනු ලබන මෙහෙයුම් සහ බෙදාහැරීම් කටයුතු එක් එක් ප්‍රාදේශීය තෙල් තොග ගබඩා පරිහරණය කරනු ලබන තෙල් පරිමාවන් සහ අනාගත අවශ්‍යතාවන්ට අනුකූල වන සේ එම තොග ගබඩා වැඩි දියුණු කිරීමේ හැකියාවන් පදනම් කරගෙන කාණ්ඩ දෙකකට ශ්‍රේණිගත කර ඇත.

**පළවන ශ්‍රේණියේ තොග ගබඩා**
පේරාදෙණිය, ගාල්ල, කුරුණෑගල, මඩකලපුව, අනුරාධපුර, බදුල්ල සහ කන්කසන්තුරෙයි

**දෙවන ශ්‍රේණියේ තොග ගබඩා**
කොටගල, හපුතලේ, මාතර, සරසවි උයන

කොලොන්නාව තෙල් පර්යන්තය ඉන්ධන නිෂ්පාදන වර්ග 12 ක එනම් නැප්තා, ගුවන්යානා පෙට්‍රල් 100 ඔක්ටේන්, පෙට්‍රල් 95 ඔක්ටේන්, පෙට්‍රල් 92 ඔක්ටේන්, භූමිතෙල්, ගුවන් යානා ඉන්ධන (Jet A-1), කර්මාන්ත සඳහා වූ භූමිතෙල්, විශේෂ තාපාංක නිෂ්පාදන, සුපිරි ඩීසල්, ඔටෝ ඩීසල්, දැවි තෙල් (800 sec), දැවි තෙල් (අධි සල්පර්) 1500 sec යනාදියෙහිමෙහෙයුම් කටයුතු සිදු කරන අතර එම නිෂ්පාදන ගබඩා කිරීමේ ටැංකි ධාරිතාවයන් පහත 3.1 වගුවෙන් පෙන්නුම් කර ඇත.

3.1 වගුව — ටැංකි ධාරිතාව - කොලොන්නාව පර්යන්තය

| ඉන්ධන වර්ගය | ගබඩා ධාරිතාව (මෙ.ටො) |
|---|---|
| නැප්තා | 13,570 |
| ඔක්ටේන් 95 පෙට්‍රල් යූරෝ 4 | 17,827 |
| ඔක්ටේන් 92 පෙට්‍රල් | 41,641 |
| භූමිතෙල් | 16,700 |
| ගුවන් යානා ඉන්ධන | 40,463 |
| ඔටෝ ඩීසල් | 27,564 |
| සුපිරි ඩීසල් යූරෝ 4 | 12,940 |
| දැවි තෙල් 800/1000 Sec | 48,683 |
| SBP | 770 |
| කාර්මික භූමිතෙල් | 1,564 |
| එකතුව | 221,722 |

මුතුරාජවෙල පර්යන්තය මඟින් පෙට්‍රල් 92 ඔක්ටේන්, ඔටෝ ඩීසල් සහ දැවි තෙල් (අඩු සල්ෆර්) 1500 sec වර්ග 03 ක මෙහෙයුම් කටයුතු සිදු කරන අතර එම නිෂ්පාදන සහ ටැංකි ධාරිතාවයන් පහත 3.2 වගුවෙන් පෙන්නුම් කර ඇත.

3.2 වගුව — ටැංකි ධාරිතාව - මුතුරාජවෙල පර්යන්තය

| ඉන්ධන වර්ගය | ගබඩා ධාරිතාව (මෙ.ටො) |
|---|---|
| පෙට්‍රල් 92 ඔක්ටේන් | 53,829 |
| ඔටෝ ඩීසල් | 117,039 |
| දැවි තෙල් (අඩු සල්ෆර්) 1500 sec | 51,904 |
| එකතුව | 222,772 |

## 3.2 ඉන්ධන බෙදාහැරීම

දිවයින පුරා ඉන්ධන බෙදාහැරීමේ ක්‍රියාවලිය තුල ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ සහ ලංකා ඉන්දියානු තෙල් සමාගමේ ඉන්ධන අවශ්‍යතාවයන්ට අනුව ඛනිජතෙල් බෙදාහැරීම් කටයුතු ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ බෙදාහැරීම් අංශය මගින් සිදු කරනු ලබයි. ඒ සඳහා කොලොන්නාව නිමාව සහ මුතුරාජවෙල පර්යන්ත මගින් දිවයින පුරා ඉන්ධන බෙදාහැරීම් කටයුතු නිසි අයුරින් ක්‍රියාත්මක කරයි. ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ බෙදාහැරීම් කාර්යාංශය යටතේ දියින පුරා තොග ගබඩා 11 ක් සහ එක් දුම්රිය පස ගබඩාවක් ස්ථාපනය කර ඇති අතර කොලොන්නාව පර්යන්තය සහ මුතුරාජවෙල පර්යන්තයේ සිට තොග ගබඩා සඳහා ඉන්ධන බෙදාහැරීමට දුම්රිය ගැල් සහ ඉන්ධන ටැංකි රථ යොදා ගනු ලැබේ. ගුවන් යානා ඉන්ධන කොලොන්නාව නිමාවේ ගබඩා කර ඇති අතර එම ඉන්ධන කටුනායක ගුවන් තෙල් පර්යන්තය දක්වා දිනපතා ප්‍රවාහනය කිරීම දුම්රිය ගැල් මගින් සහ ටැංකි රථ මගින් සිදු කරනු ලැබේ. කොලොන්නාව නිමාවේ. ගබඩා කර ඇති දූවිතෙල් විදුලි බලාගාර වෙත නළ මාර්ගයක් සහ ටැංකි රථ මගින් ප්‍රවාහනය කරනු ලැබේ.

සපුගස්කන්ද පිහිටි පිරිපහදුව මගින් නිපදවන ඛනිජතෙල් නිෂ්පාදන සහ කොළඹ වරායේ පිහිටි ඩොල්පින් ජැටිය මගින් ගොඩබාන නිමි ඛනිජතෙල් නිෂ්පාදන කොළොන්නාව පර්යන්තයේ ගබඩා කරන අතර කෙරවලපිටිය වෙරළට කි.මී 06ක් පමණ දුරින් පිහිටි එක් අන්ත නැංගුරම්පොළ බෝයා පද්ධතිය මගින් ගොඩබාන ආනයනික නිමි ඛනිජතෙල් නිෂ්පාදන පමණක් මුතුරාජවෙල පර්යන්තයේ ගබඩා කරනු ලබයි.

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්තය මගින් 2018 වර්ෂයේ අලෙවි කරන ලද නිෂ්පාදන ප්‍රමාණයන් පහත 3.3 සහ 3.4 වගු මගින් පෙන්වයි. ඒ අනුව වාර්තා කරනු ලබන මුළු ප්‍රමාණය කි.ලී. 2,851,218 කි. කොලොන්නාව සහ මුතුරාජවෙල පර්යන්තයන්හි මුළු විකුණම් මගින් සියයට 66 ක ප්‍රමාණයක් කුලී බවුසර් රථවලින් ප්‍රවාහනය කර ඇත. ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාග මේ බවුසර් රථවලින් සියයට 11 ක් ද, නළ පද්ධතිය මගින් සියයට 09 ක් ද ප්‍රවාහනය කර ඇත. වාර්තාකරනු ලබන කාලය තුල ඉන්ධන විකුණුම්වලින් සියයට 1ක් පමණක් දුම්රිය ගැල් මගින් ප්‍රවාහනය කර ඇති අතර ඉතිරි සියයට 13 ක ප්‍රමාණය පාරිභෝගිකයන් විසින්ම ලබාගෙන ඇත. දිවයින පුරා පිහිටි තොග ගබඩාවල විකුණුම්වලින් සියයට 53 ක් ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ බවුසර් රථවලින් ප්‍රවාහනය කර ඇත. සියයට 40 ක් කුලී බවුසර් රථවලින් ප්‍රවාහනය කර ඇති අතර ඉතිරි සියයට 7ක ප්‍රමාණය පාරිභෝගි කයන් විසින්ම ලබාගෙන ඇත.

3.3 වගුව — ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ කොලොන්නාව හා මුතුරාජවෙල තොග ඉන්ධන අලෙවිය - 2018

| ඉන්ධන වර්ගය | බෙදාහැරීමේ මාධ්‍යය | මුළු ධාරිතාවය (කි.ලී) | එකතුව (කි.ලී) |
|---|---|---|---|
| පෙට්‍රල් 92 ඔක්ටේන් | වැගන් | - | 872,975.40 |
| | ලං.ඛ.තො.ග.ප.සමාගම | 167,884.20 | |
| | පුද්ගලික | 590,102.70 | |
| | පාරිභෝගික | 114,988.50 | |

| | | | |
|---|---|---|---|
| ඔටෝ ඩීසල් | වැගන් | 38,341.98 | 1,290,945.51 |
| | ලං.ඛ.තෙ.ග.ප.සමාගම | 79,704.90 | |
| | පුද්ගලික | 848,020.80 | |
| | පාරිභෝගික | 156,129.60 | |
| | නළ මාර්ග | 168,748.23 | |
| භූමිතෙල් සහ කාර්මික භූමිතෙල් | ලං.ඛ.තෙ.ග.ප.සමාගම | 12,929.40 | 163,462.20 |
| | පුද්ගලික | 133,689.60 | |
| | පාරිභෝගික | 16,843.20 | |
| ලංකා දැවි තෙල් | වැගන් | 2,135.97 | 147,859.27 |
| | ලං.ඛ.තෙ.ග.ප.සමාගම | 1,023.00 | |
| | පුද්ගලික | 18,942.00 | |
| | පාරිභෝගික | 45,018.60 | |
| | නළ මාර්ග | 80,739.70 | |
| ලංකා සුපර් ඩීසල් | ලං.ඛ.තෙ.ග.ප.සමාගම | 10,236.60 | 115,156.80 |
| | පුද්ගලික | 93,205.20 | |
| | පාරිභෝගික | 11,715.00 | |
| පෙට්‍රල් 95 ඔක්ටේන් | ලං.ඛ.තෙ.ග.ප.සමාගම | 29,818.80 | 252,120.00 |
| | පුද්ගලික | 202,461.60 | |
| | පාරිභෝගික | 19,839.60 | |
| ගුවන් යානා ඉන්ධන | වැගන් | - | 5,075.40 |
| | ලං.ඛ.තෙ.ග.ප.සමාගම | 5,075.40 | |
| | පුද්ගලික | - | |
| | පාරිභෝගික | - | |
| **X Tra Mile** | වැගන් | - | 2,145.00 |
| | ලං.ඛ.තෙ.ග.ප.සමාගම | 6.60 | |
| | පුද්ගලික | 1,980.00 | |
| | පාරිභෝගික | 158.40 | |
| **SBP** | වැගන් | - | 1,478.40 |
| | ලං.ඛ.තෙ.ග.ප.සමාගම | 1,056.00 | |
| | පුද්ගලික | 422.40 | |
| | පාරිභෝගික | - | |
| එකතුව | වැගන් | **40,477.95** | **2,851,217.98** |
| | ලං.ඛ.තෙ.ග.ප.සමාගම | **307,734.90** | |
| | පුද්ගලික | **1,888,824.30** | |
| | පාරිභෝගික | **364,692.90** | |
| | නල මාර්ග | **249,487.93** | |

3.4 වගුව

## ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ දිවයින පුරා පිහිටි තොග ගබඩාවල ඉන්ධන අලෙවිය - 2018

| තොග ගබඩාව | බෙදාහැරීමේ මාධ්‍යය | මුළු ධාරිතාවය (කි.ලී) | එකතුව (කි.ලී) |
|---|---|---|---|
| අනුරාධපුරය | ලං.ඛ.තො.ග.ප.සමාගම | 58,693.80 | 193,551.60 |
| | පුද්ගලික | 108,306.00 | |
| | පාරිභෝගික | 26,551.80 | |
| බදුල්ල | ලං.ඛ.තො.ග.ප.සමාගම | 44,985.53 | 74,731.73 |
| | පුද්ගලික | 28,558.20 | |
| | පාරිභෝගික | 1,188.0 | |
| මඩකලපුව | ලං.ඛ.තො.ග.ප.සමාගම | 85,562.40 | 85,595.40 |
| | පුද්ගලික | 33.00 | |
| | පාරිභෝගික | - | |
| ගාල්ල | ලං.ඛ.තො.ග.ප.සමාගම | 81,404.40 | 164,785.50 |
| | පුද්ගලික | 76,754.70 | |
| | පාරිභෝගික | 6,626.40 | |
| හපුතලේ | ලං.ඛ.තො.ග.ප.සමාගම | 44,457.60 | 66,277.20 |
| | පුද්ගලික | 21,819.60 | |
| | පාරිභෝගික | - | |
| කන්කසන්තුරේ | ලං.ඛ.තො.ග.ප.සමාගම | 78,190.20 | 81,727.80 |
| | පුද්ගලික | 3,537.60 | |
| | පාරිභෝගික | - | |
| කොටගල | ලං.ඛ.තො.ග.ප.සමාගම | 67,557.60 | 68,712.60 |
| | පුද්ගලික | 145.20 | |
| | පාරිභෝගික | 1,009.80 | |
| කුරුණෑගල | ලං.ඛ.තො.ග.ප.සමාගම | 52,641.60 | 222,519.00 |
| | පුද්ගලික | 134,679.60 | |
| | පාරිභෝගික | 35,197.80 | |
| මාතර | ලං.ඛ.තො.ග.ප.සමාගම | 44,847.00 | 171,996.00 |
| | පුද්ගලික | 109,032.00 | |
| | පාරිභෝගික | 18,117.00 | |
| පේරාදෙණිය | ලං.ඛ.තො.ග.ප.සමාගම | 128,601.00 | 175,065.00 |
| | පුද්ගලික | 42,761.40 | |
| | පාරිභෝගික | 3,702.60 | |

| | | | |
|---|---|---|---|
| සරසවි උයන | ලං.බ.තො.ග.ප.සමාගම | 30,624.00 | 34,551.00 |
| | පුද්ගලික | 3,927.00 | |
| | පාරිභෝගික | - | |
| දුම්රිය පස ගබඩාව වව්නියාව | ලං.බ.තො.ග.ප.සමාගම | - | 4,633.20 |
| | පුද්ගලික | 4,633.20 | |
| | පාරිභෝගික | - | |
| **එකතුව** | **ලං.බ.තො.ග.ප.සමාගම** | **717,565.13** | **1,344,146.03** |
| | **පුද්ගලික** | **534,187.50** | |
| | **පාරිභෝගික** | **92,393.40** | |

# 4. ඛනිජතෙල් නිෂ්පාදන අලෙවිය

## 4.1 ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ දීප ව්‍යාප්ත ඛනිජතෙල් නිෂ්පාදන අලෙවිය

2015 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි සියලුම ඛනිජතෙල් නිෂ්පාදන සඳහා 20%ක සාමාන්‍ය මිල අඩුකිරීමක් සිදුකරන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා ඉල්ලුමේ හදිසි වැඩිවීමක් නිරීක්ෂණය වී ඇත. එසේ වුවද, මෙම වැඩිවීම වැදගත් වනුයේ පෙට්‍රල් 92 ඔක්ටේන් හා 95 ඔක්ටේන් සම්බන්ධයෙනි. මෙම ප්‍රවණතාව 2018 වර්ෂයේ ද පැවතුනි. 2018 වර්ෂයේ ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ 92 ඔක්ටේන් පෙට්‍රල් අලෙවිය ලීටර මිලියන 1,337 කි. එය 2017 වර්ෂයට සාපේක්ෂව සියයට 10%ක වැඩිවීමකි.

ඉන්ධන අරපිරිමැස්ම අතින් ඩීසල් ධාවක වාහන ඉක්මවා යන දෙමුහුන් වාහනවල සංඛ්‍යාවේ වැඩිවීමත් සමග ලංකා ඔටෝ ඩීසල් සඳහා වූ ඉල්ලුම බොහෝ දුරට ස්ථාවර වී තිබෙන අතර 2017 දී එය ඉතා සුළු ප්‍රමාණයකින් වැඩිවී තිබේ. නමුත් 2018 දී නැවතත් එය අඩුවී තිබේ. ඛනිජතෙල් සඳහා වන ඉල්ලුමෙන් සියයට 55ක්ම ප්‍රවාහන අංශය නියෝජනය කරයි. ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ දීප ව්‍යාප්ත ඛනිජතෙල් නිෂ්පාදන අලෙවිය පිළිබඳ විස්තර පහත 4.1 වගුවේ දැක්වේ.

**4.1 වගුව** ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ දීප ව්‍යාප්ත ඛනිජතෙල් නිෂ්පාදන අලෙවිය - 2016 - 2018 (මෙ.ටො.)

| නිෂ්පාදන වර්ගය | සිල්ලර අලෙවිය | | | පාරිභෝගික අලෙවිය | | | සමස්ත අලෙවිය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2016 | 2017 | 2018 | 2016 | 2017 | 2018 | 2016 | 2017 | 2018 |
| ලංකා පෙට්‍රල් - 92 ඔක්ටේන් | 850,105 | 916,426 | 1,013,250 | 4,793 | 4,594 | 4,448 | 854,898 | 921,020 | 1,017,698 |
| ලංකා පෙට්‍රල් - 95 ඔක්ටේන් | 105,698 | 131,483 | 149,736 | 4,546 | 4,405 | 4,822 | 110,244 | 135,888 | 154,557 |
| ලංකා ඔටෝ ඩීසල් | 1,322,812 | 1,331,815 | 1,375,662 | 552,557 | 587,152 | 423,316 | 1,875,369 | 1,918,967 | 1,798,978 |
| ලංකා සුපර් ඩීසල් | 62,962 | 74,656 | 82,513 | 214 | 147 | 320 | 63,177 | 74,803 | 82,833 |
| ලංකා භූමිතෙල් | 130,954 | 155,074 | 203,150 | 554 | 542 | 438 | 131,508 | 155,616 | 203,588 |
| ලංකා කර්මාන්ත භූමිතෙල් | 586 | 467 | 1,644 | 4,840 | 4,590 | 4,304 | 5,426 | 5,067 | 5,948 |
| ලංකා රසායනික නැප්තා | - | - | - | 120,187 | 139,303 | 69,357 | 120,187 | 139,303 | 69,357 |
| ලංකා දැවි තෙල් 800 | - | - | - | 504,973 | 472,601 | 330,816 | 504,973 | 472,601 | 330,816 |
| ලංකා දැවි තෙල් 1500 (වැඩි සල්ෆර්) | - | - | - | 37,384 | 60,879 | 99,799 | 37,384 | 60,879 | 99,799 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ලංකා දැවි තෙල් 3500 | - | - | - | - | - | - | - | - | - |
| ලංකා දැවි තෙල් 1500 (අඩු සල්ෆර්) | - | - | - | 83,185 | 240,016 | 199,720 | 83,186 | 240,016 | 199,720 |
| ජෙට් ඒ 1 | - | - | - | 424,741 | 455,680 | 421,774 | 424,741 | 455,680 | 421,774 |
| ලංකා සොල්වන්ට් (SBP) | - | - | - | 884 | 617 | 1,270 | 884 | 617 | 1,270 |

4.1 ප්‍රස්ථාරය ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් හා ගුවන්යානා ඉන්ධන අලෙවිය 2014 - 2018 (මෙ.ටො. 000)




## 4.2 ඉන්ධන අලෙවිහල්

නව පිරවුම්හල් නවීන පහසුකම්වලින් සමන්විත අතර 2015 - 2018 කාලය තුල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නිෂ්පාදනවල උපයෝජ්‍යතාව වැඩිවී තිබේ. තවද, නවීන වාහන බොහොමයක් මෙම ඉන්ධනවලින් ධාවනය වන බැවින් පාරිභෝගිකයින්ට ඔක්ටේන් 95 පෙට්‍රල් හා සුපිරි ඩීසල් පහසුකම් මෙම නව පිරවුම්හල්වලින් ලැබෙනු ඇත. 2018 වර්ෂය අවසන් වන විට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන පිරවුම්හල් පිළිබඳ තොරතුරු පහත 4.2 වගුව මගින් දැක්වේ. එසේම, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් නව ඉන්ධන පිරවුම්හල් 46 ක් දිවයින පුරා ස්ථාපිත කිරීම සඳහා අනුමැතිය ලබාදී ඇත.

**4.2 වගුව** ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිහල් - 2018

| අංකය | පළාත | 2018 |
|---|---|---|
| 01 | බස්නාහිර පළාත | 295 |
| 02 | උතුරු පළාත | 179 |
| 03 | උතුරු මැද පළාත | 178 |
| 04 | නැගෙනහිර පළාත | 141 |
| 05 | දකුණු පළාත | 139 |
| 06 | මධ්‍යම පළාත | 100 |
| 07 | උතුරු මැද පළාත | 79 |
| 08 | ඌව පළාත | 49 |
| 09 | සබරගමුව පළාත | 72 |
| | එකතුව | 1,278 |

## 4.3 බලශක්ති අංශයට ඉන්ධන අලෙවි කිරීම

පැවති සාමාන්‍ය කාලගුණික තත්ත්වයන් හා කර්මාන්ත අංශයේ පමණක් නොව පාරිභෝගිකයන්ගේ ද ඉල්ලුම අධික නොවීම නිසා වාර්තා කරනු ලබන කාලය තුළ බලශක්ති අංශයේ ඉන්ධන අලෙවියේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් නොකරන ලදී. විදුලි බලාගාරවලට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අලෙවිය පිළිබඳව පහත 4.3 වගුවේ දැක්වේ.

**4.3 වගුව** 2011 - 2018 දක්වා විදුලි බලාගාරවලට අලෙවි කරන ලද ඉන්ධන ප්‍රමාණයන්

| වසර | ලංකා විදුලි බල මණ්ඩලය | | | | | | ස්වාධීන බලශක්ති සපයන්නෝ | | | | මුලු එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ලංකා ඔටෝ ඩීසල් | | නැප්තා | | දැවි තෙල් | | ලංකා ඔටෝ ඩීසල් | | දැවි තෙල් | | පරිමාව (ලීටර ‘000’) | වටිනාකම (රු.මි.) |
| | පරිමාව (ලීටර ‘000’) | වටිනාකම (රු.මි.) | පරිමාව (ලීටර ‘000’) | වටිනාකම (රු.මි.) | පරිමාව (ලීටර ‘000’) | වටිනාකම (රු.මි.) | පරිමාව (ලීටර ‘000’) | වටිනාකම (රු.මි.) | පරිමාව (ලීටර ‘000’) | වටිනාකම (රු.මි.) | | |
| 2011 | 184,476 | 14,340 | 67,131 | 4,512 | 202,797 | 8,112 | 171,087 | 14,009 | 772,204 | 33,388 | 1,397,695 | 74,361 |
| 2012 | 251,599 | 27,693 | 89,701 | 7,491 | 203,315 | 12,655 | 213,443 | 21,094 | 881,606 | 57,831 | 1,639,664 | 126,764 |
| 2013 | 39,650 | 4,778 | 104,019 | 9,362 | 153,240 | 12,832 | 28,823 | 3,436 | 401,668 | 33,889 | 727,400 | 64,297 |
| 2014 | 191,105 | 23,113 | 136,091 | 12,248 | 165,423 | 14,992 | 138,579 | 16,828 | 455,518 | 46,653 | 1,086,716 | 113,834 |
| 2015 | 25,511 | 2,438 | 143,879 | 10,735 | 18,461 | 1,522 | 58,589 | 5,647 | 213,249 | 17,214 | 459,689 | 37,556 |
| 2016 | 141,006 | 13,395 | 174,270 | 12,896 | 258,643 | 20,691 | 223,968 | 21,250 | 156,968 | 12,711 | 954,855 | 81,213 |
| 2017 | 249,424 | 23,695 | 201,989 | 14,947 | 269,368 | 21,549 | 147,906 | 14,051 | 432,615 | 34,609 | 1,301,302 | 108,851 |
| 2018 | 149,174 | 14,783 | 100,568 | 7,442 | 233,604 | 19,553 | 57,311 | 5,771 | 325,569 | 27,212 | 866,226 | 74,761 |

## 4.4 ලිහිසි තෙල් අලෙවිය

2017 දෙසැම්බර් මාසයේ දී ආරම්භ කිරීමට නියමිතව තිබූ ලිහිසි තෙල් නිෂ්පාදනාගාරය ආරම්භ කිරීම ප්‍රමාදවීමත් සමග පසුගිය වර්ෂ දෙක පුරාවට පවත්වාගෙන එනු ලැබූ ලිහිසිතෙල්වල වෙළඳපොළ කොටස පවත්වා ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගතවී ඇත. මෙම යන්ත්‍රාගාරය 2019 වර්ෂයේ මුල්භාගයේ දී ආරම්භ කිරීමත් සමග ලිහිසි තෙල් අලෙවිය සැලකිය යුතු ප්‍රතිශතාත්මක අගයකින් වර්ධනය කර ගැනීමට ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සැලසුම්කර ඇත. ඒ අනුව 2020 දී ලිහිසිතෙල් කර්මාන්තයේ නියමුවා වෙමින් එහි වෙළඳපොළ කොටස සියයට 25 දක්වා වර්ධනය කරගැනීම අපේක්ෂාවයි. 2011 සිට 2018 දක්වා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ලිහිසි තෙල් අලෙවිය 4.4 වගුවේ දක්වේ.

**4.4 වගුව** ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලිහිසි තෙල් අලෙවිය 2011 - 2018 (කි.ලී.)

| වසර | පරිමාව (කි.ලී.) | වටිනාකම රු.මිලියන |
|---|---|---|
| 2011 | 5,146 | 1,593 |
| 2012 | 5,602 | 1,986 |
| 2013 | 5,520 | 2,086 |
| 2014 | 5,687 | 2,384 |
| 2015 | 5,326 | 2,244 |
| 2016 | 5,445 | 2,296 |
| 2017 | 5,412 | 2,326 |
| 2018 | 4,083 | 1,883 |

## 4.5 කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවිය

- රජය විසින් ග්ලයිෆොසෙට් කෘෂි රසායන ද්‍රව්‍යය ආනයනය තහනම් කිරීමත් සමග තේ සහ රබර් වතු අංශය සඳහා පමණක් ග්ලයිෆෝසෙට් ආනයන කිරීමටත්, නැවත ඇසුරුම් කිරීමටත් සිපෙට්කෝ ග්ලයිෆෝසෙට් නමින් සැපයීමටත් අමාත්‍ය මණ්ඩලය විසින් එහි ඒකමතික අනුමැතිය ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාවට ලබා දී ඇත.

- සිපෙට්කෝ ග්ලයිෆෝසෙට් හඳුන්වා දීමෙන් පසු 2017 වර්ෂය තෙක් පැවති අලාභ තත්ත්වය මගහරවා ගනිමින් 2010-2015 කාලය තුළ පැවති තත්ත්වයට පත්වෙමින් පවතී. 2015 සිට 2018 දක්වා ආනයනය කරන ලද කෘෂිරසායන ප්‍රමාණයන් පහත 4.5 වගුවේ දැක්වේ.

**4.5 වගුව** ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ආනයනය කරන ලද කෘෂි රසායන 2015 - 2018

| නිෂ්පාදනය | ප්‍රමාණය | | වටිනාකම (ඇ.ඩො) | වටිනාකම - රු.මි දල (දේශිය මිලදී ගැනුම්) |
|---|---|---|---|---|
| | ලීටර් | කි.ග්‍රෑම් | | |
| **2015** | | | | |
| ග්ලයිපෝසෙට් | 508,000 | - | 171,880 | - |
| ප්‍රොෆෙනොපොස් | 5,000 | - | 28,250 | - |
| පෙන්තේට් 50% | 5,000 | - | 37,750 | - |
| එම්.සී.පී.ඒ. 60% | 5,000 | - | - | 3.42 |
| **එකතුව - 2015** | **523,000** | **-** | **237,880** | **3.42** |

| 2016 | | | | |
|---|---|---|---|---|
| බී.පී.එම්.සී.50% | 10,000 | - | 36,700 | - |
| ඇසීෆේට් 75% | - | 14,400 | 151,200 | - |
| කැප්ටාන් 50% | - | 3,000 | 16,800 | - |
| ඩියුරෝන් 80% | - | 28,000 | 130,200 | - |
| එම්.සී.පී.ඒ. 60% | 10,000 | - | - | 7.03 |
| මැන්කොසෙබ් 80% WP | - | 14,000 | 41,300 | - |
| **එකතුව - 2016** | **20,000** | **59,400** | **376,200** | **7.03** |
| 2017 | | | | |
| ඇබොමැක්ටින් | 2,000 | - | - | 5.0 |
| පෙට්ලැක්ර | 3,000 | - | - | 3.4 |
| ටෙබිකොන්සෝල් | 1,000 | - | - | 2.5 |
| මොන්කොසෙබ් | | 14,000 | - | 6.5 |
| **එකතුව - 2017** | **6,000** | **14,000** | **-** | **17.41** |
| 2018 | | | | |
| කෘමිනාශක | 12,000 | - | 56,200 | |
| වල්නාශක | 5,440,000 | 30,000 | 1,415,716 | |
| දිලීරනාශක | 3,000 | 17,000 | 606,710 | |
| **එකතුව - 2018** | **5,455,000** | **47,000** | **2,078,626** | |

## 4.6 තාර අලෙවිය

ඉන්ධන පිරිපහදුවේ පිරිපහදුවේ පිරිපහදු ක්‍රියාවලිය සඳහා කාලයක් තිස්සේ භාවිතා කරන ලද ඉරාන සැහැල්ලු බොරතෙල් වෙනුවට මර්බන් බොරතෙල් භාවිතා කිරීම හේතුවෙන් මර්බන් බොරතෙල්වල දුර්වල රසායනික සංයෝගයක් පැවතීම නිසා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදුවේ තාර නිෂ්පාදනය නැවතුනි. තාර නිෂ්පාදනය සඳහා සුදුසු අමුද්‍රව්‍යක් (දැවිතෙල්) ආනයනය කරමින් නව සංකල්පයක් වශයෙන් පිරිපහදුවේ තාර නිෂ්පාදනය නැවත ආරම්භ කරන ලදී.

ඒ අනුව, ආනයනික දැවිතෙල් භාවිතයෙන් තාර නිෂ්පාදනය 2018 ජූනි 5 දින නැවත ආරම්භ කරන ලද අතර තොග තාර අලෙවිය 2018 ජූනි 19 දින ආරම්භ කරන ලදී. එතැන්පටන් පවතින අමුද්‍රව්‍ය අනුව තාර නිෂ්පාදනය අඛණ්ඩව සිදුකරගෙන එන අතර 2018 වර්ෂය තුළ දී අලෙවි කරන ලද තාර ප්‍රමාණයන් පහත 4.6 වගුව මඟින් පෙන්වයි.

4.6 වගුව ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ තාර අලෙවිය

| ද්‍රව්‍යය | ප්‍රමාණය | |
|---|---|---|
| | බැරල් | තොග (කි.ග්‍රෑ) |
| ඇස්ෆෝල්ට් 80/100 | 6,488 | 2,867,040 |
| ඇස්ෆෝල්ට් 60/70 | 19,250 | 7,815,440 |

## 4.7 ගුවන් යානා ඉන්ධන අලෙවිය

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ගුවන් යානාවලට, ඉන්ධන නැවත පිරවීමේ පර්යන්තය (BIA), මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ ගුවන් යානාවලට නැවත ඉන්ධන පිරවීමේ පර්යන්තය (MIA) සහ රත්මලාන ගුවන්

තොටුපොළේ ඉන්ධන නැවත පිරවීමේ ඒකකය යන පර්යන්ත තුන මඟින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගුවන් යානා අංශය සිය සේවා සපයනු ලබයි.

රාජ්‍ය ආයතනයක් හා ශ්‍රී ලංකාවේ ගුවන් යානා ඉන්ධන එකම සැපයුම්කරු වශයෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ජාතික ආර්ථිකයේ ප්‍රධාන කොටස්කරුවෙකු බවට පත්ව ඇත. දැඩි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වෙමින් ගනුදෙනුකාර ගුවන් සේවාවන්වලට අවශ්‍ය ගුවන් යානා ඉන්ධන ඉල්ලුම කාර්යක්ෂමව හා සඵල අයුරින් සම්පූර්ණයෙන්ම ඉටු කෙරෙන බව තහවුරු කර ගැනීම සම්බන්ධයෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වගකිව යුතුවේ.

ගොඩබිමට සාපේක්ෂව මිනිස් ජීවිත විශාල සංඛ්‍යාවක් අවදානමට ලක්විය හැකි බැවින්, අනිකුත් සියලුම සාධක අතර ගුවනේදී ආරක්ෂාව තහවුරු කිරීම පිණිස ලොව මුළුල්ලේ ම ගුවන් යානා ඉන්ධන සැපයීම කෙරෙහි, ඉහළ ම ප්‍රමුඛත්වයට හා සැලකිල්ලට භාජනය වනු ලැබේ. ඉහළ මට්ටමක ගුණාත්මක ආරක්ෂාවක් පවත්වාගෙන යෑම හා ගුණාත්මකභාවය පාලනය කිරීමේ වැඩසටහනක්, ගුවන් යානාවලට නැවත ඉන්ධන පිරවීමේ කර්මාන්තය තුළ අතිශය වැදගත් වේ.

මෙහිදී, පිරවීමේ ලක්ෂ්‍යය දක්වා වූ එම සැපයුම් දාමයේ දී සේවාව සහ නිෂ්පාදන යන දෙකෙහිම ගුණාත්මකභාවය තහවුරු කර ගැනීම පිණිස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සෑම පූර්වාරක්ෂක පියවරක්ම ගෙන තිබේ. Joint Inspection Group (JIG) of Customer Airlines, ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා අධිකාරිය, ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (IATA) සහ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය ඇතුළත් බොහෝ ජාත්‍යන්තර සංවිධාන මගින් අදාල පහසුකම් වාර්ෂික විගණනයට භාජනය කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ ගුවන් සේවා ඉතිහාසයේ ප්‍රථම වරට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ගුවන් යානාවලට ඉන්ධන නැවත පිරවීමේ පර්යන්තය සඳහා 2014 වර්ෂයේ සිට "හොඳයි" (සාමාන්‍යයට ඉහළ තත්ත්වය) යන තරාතිරම පිරිනැමීම දිනා ගැනීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සාක්ෂාත්කර ගැනීම වැදගත්ය. මෙම තත්ත්වය ලබාගැනීම ලෝකයේ ගුවන් සේවා සඳහා ඉන්ධන නැවත පිරවීමේ සේවා සපයන්නෙකු ලබාගන්නා ඉහළම ජයග්‍රහනයකි.

**4.2 ප්‍රස්ථාරය** ගුවන්යානා ඉන්ධන අලෙවියෙන් ලද ආදායම 2011 - 2018 (රු.මිලියන)




ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින්, ලොව පුරා විහිදුන ගුවන් යානා ගනුදෙනුකරුවන් හා තෙවන පාර්ශ්වීය ඉන්ධන අලෙවි සමාගම් 60 කට පමණ සේවාව සපයනු ලබන අතර, දිනක අලෙවිය සාමාන්‍යයෙන් ලීටර මිලියන 1.6 කි. ප්‍රධාන පෙළ ගුවන් යානා ගනුදෙනුකරුවන් සමහරෙක් පහත දැක්වේ.

- ශ්‍රී ලන්කන් ගුවන් යානා සමාගම - ගුවන් යානා ගනුදෙනුකරු
- එමිරේට්ස් - ගුවන් යානා ගනුදෙනුකරු
- ටර්කිෂ් එයාලයින්ස් - ගුවන් යානා ගනුදෙනුකරු
- සෞදි ඇරබියන් එයාලයින්ස් - ගුවන් යානා ගනුදෙනුකරු
- එයාර් ඇරබියා - ගුවන් යානා ගනුදෙනුකරු (පිරිමැසුම් ගුවන් සේවා)
- කාගෝ එයාර් චාටරින්ග් - තෙවන පාර්ශවකරු
- ඕමාන් එයාර් - ගුවන් යානා ගනුදෙනුකරු
- ජෙට්එක්ස් ෆ්ලයිට් සපෝට් - තෙවන පාර්ශවකරු
- ඇස්ටර් ජෙට් ෆුවල් ප්‍රයිවට් ලිමිටඩ් - තෙවන පාර්ශවකරු
- මූන්ජෙට් ලයිට් සපෝට් - තෙවන පාර්ශවකරු
- තායි එයාවේස් - ගුවන් යානා ගනුදෙනුකරු
- යූවීඑයා - තෙවන පාර්ශවකරු
- ENOC - තෙවන පාර්ශවකරු
- ඒවියේෂන් සර්විස් මැනේජ්මන්ට් - තෙවන පාර්ශවකරු
- ක්වේට් එයාලයින් - ගුවන් යානා ගනුදෙනුකරු
- වර්ල්ඩ් ෆුවල් සර්විස් - තෙවන පාර්ශවකරු
- කටාර් එයාවේස් - ගුවන් යානා ගනුදෙනුකරු
- හඩීඩ් ෆුවල් ඔපරේෂන්ස් ඩිපාට්මන්ට් - තෙවන පාර්ශවකරු
- ස්පයිස් ජෙට් - ගුවන් යානා ගනුදෙනුකරු

- ➢ මිහින් ලංකා - ගුවන් යානා ගනුදෙනුකරු
- ➢ ඔරෝරා ඒවියේෂන් - තෙවන පාර්ශවකරු
- ➢ රොටානා - ගුවන් යානා ගනුදෙනුකරු
- ➢ යුනයිටඩ් ඒ වියේෂන් සර්විසස් - තෙවන පාර්ශවකරු

## 4.8 පිරිපහදු නිෂ්පාදනය

සපුගස්කන්දේ පිහිටි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදුව මෙරට ඛනිජ තෙල් අවශ්‍යතාවයෙන් දළ වශයෙන් තුනෙන් එකකට දායක වෙයි. 2005 සිට 2018 දක්වා වූ කාලසීමාව තුළ දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පිරිපහදුවේ තෙල් නිෂ්පාදනය පහත 4.6 වගුවෙන් පෙන්වන අතර, 2018 දක්වා පිරිපහදුවේ නිෂ්පාදනයේ ප්‍රතිශතය 4.3 ප්‍රස්ථාරයෙන් පෙන්වයි.

4.3 ප්‍රස්ථාරය පිරිපහදුවේ නිෂ්පාදන - 2018 (ප්‍රතිශත වලින්)



## 4.6 වගුව ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පිරිපහදුවේ නිෂ්පාදනය - 2005 - 2018 (මෙ.ටො.)

| වසර | බොර තෙල් යෙදවුම් | නිපැයුම | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පෙට්‍රල් | ඔටෝ ඩීසල් | සුපිරි ඩීසල් | දැවි තෙල් 500 sec | දැවි තෙල් 800 sec | දැවි තෙල් 1000 sec | දැවි තෙල් 1500 sec | දැවි තෙල් 3500 sec | භූමිතෙල් | රසායනික නැප්තා | තාර | එල්පීජී | ජෙට් ඒ -1 | ද්‍රාවක Solvent | මුළු නිපැයුම |
| 2005 | 1,977,751 | 160,684 | 571,169 | 7,190 | 20,580 | 37,408 | 68,054 | 336,271 | 236,749 | 142,092 | 113,308 | 51,785 | 13,047 | 113,831 | 4,044 | 1,876,212 |
| 2006 | 2,140,132 | 193,585 | 628,210 | - | 16,510 | 35,135 | 88,063 | 372,985 | 253,533 | 143,930 | 109,175 | 5,386 | 14,721 | 130,926 | 5,878 | 2,048,037 |
| 2007 | 1,899,078 | 163,291 | 444,593 | - | - | 100,934 | 4,505 | 393,850 | 272,380 | 97,409 | 91,768 | 5,197 | 16,237 | 171,043 | 4,559 | 1,795,766 |
| 2008 | 1,868,346 | 163,702 | 451,132 | - | - | 18,801 | - | 468,002 | 244,402 | 111,133 | 100,416 | 45,450 | 16,208 | 154,433 | 2,562 | 1,776,241 |
| 2009 | 2,014,850 | 179,096 | 485,302 | - | - | 35,901 | - | 462,577 | 282,048 | 82,513 | 105,159 | 41,588 | 24,348 | 195,406 | 972 | 1,894,910 |
| 2010 | 1,752,715 | 157,972 | 441,545 | - | - | 47,918 | - | 396,034 | 241,930 | 92,775 | 84,289 | 34,945 | 22,927 | 126,407 | 2,734 | 1,649,474 |
| 2011 | 2,003,561 | 206,466 | 501,122 | - | - | 54,283 | - | 480,854 | 244,758 | 92,924 | 80,011 | 46,062 | 24,150 | 155,357 | 3,814 | 1,889,766 |
| 2012 | 1,596,059 | 151,536 | 394,161 | - | - | 66,953 | - | 364,607 | 217,240 | 74,909 | 69,841 | 26,548 | 17,437 | 93,159 | 3,699 | 1,480,090 |
| 2013 | 1,643,218 | 143,959 | 389,717 | - | - | 56,011 | - | 521,224 | 146,550 | 57,297 | 86,505 | 5,025 | 22,168 | 124,544 | 2,987 | 1,555,979 |
| 2014 | 1,760,170 | 152,261 | 495,983 | - | - | 52,011 | - | 419,579 | 169,037 | 65,195 | 120,116 | - | 28,116 | 168,481 | 2,514 | 1,673,293 |
| 2015 | 1,765,466 | 165,148 | 532,555 | - | 11,373 | 344,156 | - | 204,847 | - | 78,360 | 148,247 | - | 10,457 | 164,314 | 1,594 | 1,661,051 |
| 2016 | 1,746,180 | 165,782 | 578,657 | - | - | 478,901 | - | - | - | 104,244 | 154,467 | - | 8,837 | 147,525 | 635 | 1,639,047 |
| 2017 | 1,646,041 | 164,564 | 506,046 | - | - | 431,524 | - | - | - | 59,782 | 141,688 | - | 19,416 | 236,360 | 619 | 1,559,999 |
| 2018 | 1,698,634 | 165,782 | 567,577 | - | - | 423,577 | - | - | - | 35,195 | 140,575 | 12,737 | 22,084 | 237,293 | 1,596 | 1,604,870 |

## 5. යටිතල පහසුකම් සංවර්ධනය

### 5.1 ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව

**(I) සපුගස්කන්ද ගබඩා පහසුකමෙහි නව ටැංකි ස්වයංක්‍රීයන පද්ධතිය උත්ශ්‍රේණිගත කිරීම**

සපුගස්කන්ද තෙල් ටැංකි සංකීර්ණයේ ටැංකි ස්වයංක්‍රීයන පද්ධතිය, දැනට තිබෙන මෘදුකාංග සහ එයට සහායක උපකරණ මේ වන විට යල් පැනගොස් ඇති හෙයින් ස්වයංක්‍රීයන පද්ධති උත්ශ්‍රේණිගත කිරීමේ ව්‍යාපෘතිය අරම්භ කරන ලදී. මේ වන විට ස්වයංක්‍රීයන පද්ධතිය සවිකර ඇති අතර පරීක්ෂණ කටයුතු අවසන් කර ඇත.

**(II) පිරිපහදුවේ නව වාෂ්ප බොයිලේරුවක් සවිකිරීම**

පැරණි බලශක්ති බොයිලේරු ප්‍රතිස්ථාපනය කිරීමේ හා පිරිපහදු මෙහෙයුම් සඳහා අවශ්‍ය පැසුරුම්වල විශ්වසනීයත්වය වැඩි කිරීමේ අපේක්ෂාවෙන් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. බොයිලේරුව සවිකර බලගැන්වීමේ ක්‍රියාවලිය සිදුකර අවසන් කරන ලදී. එහි පරීක්ෂණ කටයුතු මේ වන විට සිදුකරමින් පවතී.

**(III) පිරිපහදුවේ මෝටරයක් සහිත වායු සම්පීඩකයක් සවිකිරීම**

පිරිපහදු මෙහෙයුම් සඳහා අත්‍යවශ්‍ය වන වායු පද්ධතියේ විශ්වසනීයත්වය වැඩි කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. සියළුම උපකරණ සකසන මිදවුම් කපාට හා උපාංග සහිත වූ වායු සම්පීඩන ඒකක සඳහා ඇනවුම භාර දී තිබේ. වායු සම්පීඩන ඒකකය සඳහා සහ නළ පද්ධතිය සැකසීම සඳහා ඇණවුම් භාරදෙන ලදී. නළ සැකසීමේ කටයුතු සිදු කරමින් පවතී. වායුසම්පීඩන යන්ත්‍රයේ අත්තිවාරම සැකසීම, එම යන්ත්‍රය සවිකරන ගොඩනැගිල්ල, වයර් ජාලය සඳහා ලංසු කැඳවන ලදී. ලංසු ඇගයීම අවසන් කර ඇති අතර ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාගැනීමට නියමිතය.

**(IV) තෙල් පිරිපහදුව සඳහා Crude Distillation Column, Gas Oil Hydro – Treator Unit Reactor සහ Plat Former Unit ප්‍රතිස්ථාපනය කිරීම**

පිරිපහදුවේ මෙහෙයුම් කටයුතු සඳහා වන බාධාවන් සහ අවදානම් මගහරිමින් අවම තාක්ෂණික යෙදවුමකින් ඉහළ නිෂ්පාදන ලාභදායීත්වයක් ඇතිකර ගනිමින් පැසුරුම් ඒකකවල විශ්වාසනීයත්වය වර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මේ සම්බන්ධයෙන් පිරිවැය ඇස්තමේන්තුව සමග ශක්‍යතා අධ්‍යයනයක් (FEED) සිදුකිරීම සඳහා මිළ ගණන් කැඳවීමට සුදුසු පාර්ශවයන් තෝරා ගැනීම සඳහා අභිප්‍රාය ප්‍රකාශ කිරීම් කැඳවන ලදී. මෙම අධ්‍යයනය සඳහා සුදුසුකම්ලත් පාර්ශව දෙකක් තෝරා ගනු ලැබිණි. ඒ අනුව එම තෝරාගත් පාර්ශව දෙකෙන් ලංසු ඉදිරිපත් කරන ලෙස දන්වන ලද අතර ලබාදුන් ලංසු 2018.07.13 දින විවෘත කරන ලදී. UOP LLC වෙතින් ඉදිරිපත් කරන ලද එක් ලංසුවක් පමණක් ලැබී තිබුණි. ඒ අනුව, ඇගයීම් සිදුකරමින් පවතී. අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් පැහැදිළි කිරීම් ඉදිරිපත් කරන ලෙස UOP LLC සමාගම වෙතින් ඉල්ලා ඇත.

**(V) සපුගස්කන්ද ඉන්ධන පර්යන්තයේ සිට ජෙට් ඒ - 1 ගුවන්යානා ඉන්ධන ප්‍රවාහනය ආරම්භ කිරීම.**

ජෙට් ඒ - 1 ගුවන්යානා ඉන්ධන ගබඩා පහසුකම් වර්ධනය කිරීමේ සහ එම ඉන්ධන සඳහා වන සේවා ගාස්තු (throughput charges) වියදම අවම කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. භූමිතෙල් ගබඩා කරමින් පැවති ටැංකි දෙකක් ජෙට් ඒ - 1 ගබඩා කිරීමට හැකිවන පරිදි පරිවර්තනය කිරීම, ඊට අදළ නළ පද්ධතිය සවිකිරීම සහ ඉන්ධන පෙරණ උපකරණ සහිතව බවුසර් වලට ජෙට් ඒ - 1 ඉන්ධන පිරවීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත

කිරීම යනාදී සංරචක වලින් යුක්තව සපුගස්කන්ද ජෙට් ඒ - 1 ඉන්ධන පර්යන්තය ස්ථාපිත කරන ලදී.

**(VI)කොළොන්නාව ගුවන්යානා ඉන්ධන ගබඩා පහසුකම සඳහා පෙරණ සවිකිරීම.**

ගුවන් සේවා සඳහා ඉන්ධන සැපයීම සම්බන්ධයෙන් වන තාක්ෂණික සේවා දායකයාගේ නිර්දේශ මත කොළොන්නාව ඉන්ධන ගබඩා පර්යන්තයේ සිට බෙදාහරිනු ලබන ජෙට් ඒ -1 ගුවන්යානා ඉන්ධනවල ගුනාත්මකභාවය වර්ධනය කිරීමත් ජෙට් ඒ - 1 ඉන්ධන ආනයනය කර මෙරටට ගොඩබෑමේ දී එම කටයුතු කඩිනම් කිරීමත් අරමුණු කර ගනිමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

දීර්ඝකාලයක් තිස්සේ පැවති අවශ්‍යතාවයක් වශයෙන්, තාක්ෂණික සේවාදායකයාගේ නිර්දේශ මත මෙම ව්‍යාපෘතිය සාර්ථකව නිම කරණ ලදී. ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ උපදෙස් මත ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් 2018 ජනවාරි මාසයේදී සම්පූර්ණකර බලගැන්වීම කරන ලදී.

**(VII)ඩොල්පින් ජැටියේ ඉන්ධන ගොඩබෑමේ උපකරණ පුණරුත්තාපනය කිරීම**

ආනයනය කරනු ලබන පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන කොලොන්නාව ඉන්ධන නිමාව වෙත ගොඩබෑමටත් බොරතෙල් ඔරුගොඩවත්ත ගබඩා ටැංකි සහ සපුගස්කන්ද පිරිපහදුව වෙත ගොඩබෑමටත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ හිමිකාරීත්වය යටතේ 1996 වර්ෂයේ දී කොළඹ වරායේ ඩොල්පින් ජැටිය ස්ථාපනය කරන ලදී. මෙම ජැටියේ මෙහෙයුම් සහ නඩත්තු කටයුතු වර්තමායේ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම යටතේ ක්‍රියාත්මකවන ඉන්ධන මෙහෙයුම් පහසුකම් අංශය විසින් සිදුකරන ලදී කෙසේ වුවද වර්තමානයේ මෙම ජැටියේ හිමිකාරිත්වය ශ්‍රී ලංකා වරාය අධිකාරියට පැවතීම හේතුවෙන් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ හෝ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රාග්ධන ආයෝජන සිදුකිරීම පසුගිය වර්ෂ 10 - 13 කාලය තුළ නැවතී ඇත. එසේ වුවද රටේ අඛණ්ඩ ඉන්ධන සැපයුම තහවුරු කිරීම සඳහා මෙම පහසුකමේ ඉතා හදිසි අලුත්වැඩියා කටයුතු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සිදුකරමින් පවතී

## 5.2 සීමාසහිත ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

**i) කොලොන්නාවේ ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ ඉන්ධන පර්යන්ත පියවි පරිපථ රූපවාහිණි කැමරා පද්ධතියක් (CCTV) සවිකිරීම**

කොලොන්නාවේ සීමාසහිත ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ තෙල් ගබඩාව යනු ආරක්ෂක පැතිකඩෙන් බැලූ විට ප්‍රහාරයට ලක්විය හැකි ස්ථානයක් වන අතර, ක්ෂණික විපරම පමණක් නොව වෝහාරික කටයුතු උදෙසා දත්ත ගබඩා කිරීමට පියවි පරිපථ රූපවාහිණී කැමරා පද්ධතියක් (CCTV) තිබීම අත්‍යවශ්‍ය වේ. තවද, ටැංකි පද්ධතිය පොම්පාගාර හා වෙනත් වැදගත් ස්ථානද ක්ෂණික විපරමට භාජනය කළ යුතු අතර, එය වෝහාරික කටයුතු උදෙසාද වේ. එබැවින් ඉහත කරුණු උදෙසා විශ්වාසවන්ත හා සඵල පියවි පරිපථ රූපවාහිණී කැමරා පද්ධතියක් කොලොන්නාවේ තෙල් ගබඩාවේ සවිකළ යුතුව පවතී. පවත්වන ලද මූලික අධ්‍යයනය අනුව තෙල් ගබඩාව තුල විවිධ වර්ගයේ කැමරා 66 ක් පමණ සවිකරනු ලැබීමට නියමිය.

විවිධ වර්ගයේ කැමරා 66 ක් සවිකිරීමේ, තැටි සහිත ෆයිබර් දෘෂ්ඨීක ප්‍රධාන රැකුලක් හා වෙනත් උපකරණ සවිකිරීමේ සමස්ත ඇස්තමේන්තු ගත පිරිවැය දළ වශයෙන් රුපියල් මිලියන 50 කි. RFID පද්ධතිය ද යෝජිත ව්‍යාපෘතියේ විෂය පථයට ඇතුළත් කරමින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වූ බැවින් මූලිකව තීරණය කර තිබූ විෂය පථය වෙනස්

කිරීමට තීරණය කළ බැවින් ඊට අදාළ වාර්තා සකස් කරන ලදී. සමාගමේ කළමණාකාරිත්වය විසින් මෙම ව්‍යාපෘතියේ විෂයපථය තවදුරටත් විමර්ශනය කිරීමට අවශ්‍ය වූ බැවින් ලංසුකැඳවීම අවලංගු කරන ලදී. තාක්ෂණික ඇගයීම් කමිටුවට මොරටුව විශ්වවිද්‍යාලයේ නියෝජිතයෙකු පත්කිරීමට නියමිතය.

**ii) ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ මුතුරාජවෙල නිමාවේ සිවිල් කර්මාන්ත කටයුතු**

සීමාසහිත ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ මුතුරාජවෙල නිමාව 2004 වසරේ දී කාර්යාල සේවකයින් 52 ක් සමග ආරම්භ කරන ලද්දේ ඩීසල්, දැවිතෙල් සහ භූමිතෙල් තුන් වර්ගයක ඛනිජතෙල් නිෂ්පාදන දිනකට මෙට්‍රික් ටොන් 500 ක් බෙදා හැරිම පිණිසය. ඉන්ධන සඳහා රට තුල වැඩිවෙමින් පවතින ඉල්ලුම නිසා, ඉහත නිෂ්පාදන තුනට අමතරව පෙට්‍රල් බෙදා හැරිම ඇරඹීම සිදුවූ අතර, 272 ක කාර්ය මණ්ඩලයක් විසින් මුතුරාජවෙල පර්යන්තයේ සිට දිනකට ඉන්ධන මෙට්‍රික් ටොන් 6000 ක් පමණ බෙදා හරිනු ලැබේ. එම නිසා, බාධාවකින් තොරව මුතුරාජවෙල පර්යන්තයේ සිට බෙදා හරිනු ලබන වත්මන් ප්‍රමාණය එලෙසම පවත්වා ගෙන යෑමට පිටිවහලක් වශයෙන් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අවශ්‍යය. සමස්ත ඇස්තමේන්තු ගත ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 182 ක් වන අතර, ව්‍යාපෘති කාලසීමාව එක් වසරකි. මේ සම්බන්ධයෙන් උපදේශකගේ අවසාන යෝජනාව ලැබී ඇත. අවසන් ඇස්තමේන්තුව සමග ලංසු කැඳවීමේ ලේඛන සකස් කර ඇති අතර ව්‍යාපෘතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට නියමිතය.

**බවුසර් නැවැත්වීමේ අංගනය ඉදිකිරීම සඳහා ඉඩම අත්පත්කර ගැනීම**

ඒ අනුව ඉඩමේ තක්සේරු වාර්තාව ඉදිරිපත් කරන ලෙස ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට දක්වා ඇත.

**iii) කොලොන්නාව සංකීර්ණයේ නවීනතම ඛනිජතෙල් පර්යේෂණාගාරයක් සැලසුම් කිරීම, ඉදිකිරීම හා සැපයීම**

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාග මේ දැනට තිබෙන ඛනිජතෙල් පර්යේෂණාග ාරය 1962 දී ෂෙල් සමාගම විසින් නිර්මාණය කර ඉදිකරන ලද්දකි. රසායනාගාරයේ ගොඩනැගිලිවලට අදාලව වෙනස් කිරීම් හා එකතු කිරීම් සමහරක් හැර පරීක්ෂණ පමණක් නොව, සෞඛ්‍යය, ආරක්ෂාව හා පරිසරයට අදාල වූ නවතම ප්‍රමිතීන් සපුරාලීම පිණිස එය තත්ත්වයෙන් උසස් කර නොමැත. වත්මන් නවීනතම පර්යේෂණාගාරවලට සාපේක්ෂකව පර්යේෂණාගාරයේ දැනට තිබෙන උපකරණ ඉතා පැරණි ඒවා ය.

සේවාදායකයින්ට වඩාත් නිවැරදි හා කාර්යක්ෂම සේවාවක් සැලසීමට ඉවහල්වන පරිදි නවතම තාක්ෂණය/උපකරණ සහිත පර්යේෂණාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම යෝජිත ව්‍යාපෘතියේ විෂය පථයට ඇතුළත් වේ. සමස්ත ඇස්තමේන්තු ගත ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 625 ක් වන අතර, ව්‍යාපෘති කාලය මාස 8කි. මේ සඳහා ලංසු කැඳවූ අතර ලැබී ඇති ලංසු ඇගයීම සිදුකරමින් බවතී.

**iv) මහා මාර්ග හා දුම්රිය හරස් මාරුවල සහ මහවත්ත ප්‍රදේශයේ අඟල් 12 විශ්කම්භයේ නළ මාර්ග ඛණ්ඩ සවිකිරීම**

අඟල් 12 විශ්කම්භයේ කි.මී.5.5ක නල මාර්ගය කොළඹ වරායේ සිට කොලොන්නාව නිමාව දක්වා දැනට නැවත අලුත්වැඩියාවට ලක්වෙමින් පවතින අතර, ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ සේවකයන් විසින් සියයට 97.5ක වැඩ දැනටමත් නිම කර තිබේ. ඉතිරිය එනම් මහවත්ත ප්‍රදේශයේ නළමාර්ගය (මීටර් 140-2.5%) අනවසර පවුල් 20ක් පදිංචි වීම හේතුවෙන් අවසන් කිරීමට නොහැකි වී ඇත. ප්‍රතිස්ථාපනය සඳහා මෙම අනවසර පවුල් 20ට ඉවත් කිරීම සඳහා ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් රජයේ ආධාර යටතේ විධිවිධාන යොදන ලදී. එම ප්‍රදේශයේ

අවට සිටින අනවසර පවුල්වල ජනතාවද නිවාස ලබාදෙන ලෙස ඉල්ලා සිටී. මෙම ගැටළුව විසඳන තුරු ඉතිරි වැඩ සිදුකිරීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇත. සමස්ථතමේන්තු ගත ව්‍යාපෘති පිරිවැය රු මිලියන 900කි.

**v) ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ දත්ත මධ්‍යස්ථානය සඳහා ආපදා ප්‍රතිසාධන හා කළමනාකරණ මධ්‍යස්ථානයක් (DRMC) ස්ථාපිත කිරීම**

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ ආපදා ප්‍රතිසාධන හා කළමනාකරණ මධ්‍යස්ථාන (DRMC) ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, හදිසි අනතුරක් නිසා හෝ චේතනාන්විත ක්‍රියාවක් නිසා හෝ ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ දත්ත මධ්‍යස්ථානය ක්‍රියාවිරහිත වීමක් නිසා හෝ ඇතිවන ආපදාවකදී, සීමා සහිත ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ හා ලංකා ඉන්දියානු තෙල් සමාගමේ 24x7 ERP පද්ධති මෙහෙයුම්වලට වසර පුරාම සිය ව්‍යාපාරික කටයුතු සඳහා ආධාරවීමය. අදාල පද්ධතියෙන් තොරව සංවිධාන තුනටම එම ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යා නොහැකියි. මූලික දත්ත මධ්‍යස්ථානයේ දෘඩාංග උත්ශ්‍රේණිගත කිරීම, පවත්නා සර්වර් පද්ධතිවලින් නව දෘඩාංග වෙත මෘදුකාංග සංක්‍රමණය කිරීම හා, ප්‍රතිසාධන හා කළමනාකරණ මධ්‍යස්ථාන ව්‍යාපෘතිය සඳහා පාර්ශ්වයක් තීරණය කරනු ලැබීමෙන් පසු ටෙන්ඩර ක්‍රියාවලිය මාර්ග යෙන් නම්කළ ධාරක ස්ථානයක ප්‍රතිසාධන හා කළමනාකරණ මධ්‍යස්ථාන දෘඩාංග හා මෘදුකාංග ස්ථාපනය කිරීම මෙම ව්‍යාපෘතියට අයත්වේ. සමස්ත ඇස්තමේන්තු ගත ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 260 කි. මේ වන විට ව්‍යාපෘයේ කටයුතු අවසන් සැලසුම් කළ ආකාරයට නිම කර ඇත.

**vi) අනුරාධපුරයේ දැනට තිබෙන තොග ගබඩාව සංවර්ධනය කිරීම**

ගබඩා හා ගැන්ට්‍රි ධාරිතාව වැඩි කිරිමල පොම්පාගාරය, නළ පද්ධතිය හා ගිනි නිවීමේ පද්ධතිය වැඩි දියුණු කිරිමහා පරිපාලන ගොඩනැගිල්ල හා විවේකාගාරය විතැන් කිරීම යනාදිය මගින් අනාගත ඉන්ධන අවශ්‍යතා සපුරාලීම උදෙසා අනුරාධපුරයේ තිබෙන තොග ගබඩාව උත්ශ්‍රේණිගත කිරීම අවශ්‍ය වේ. සමස්ත ඇස්තමේන්තු ගත පිරිවැය රුපියල් මිලියන 300 කි.

පාංශු තත්ත්ව විමර්ෂණය සිදුකරන ලද අතර පස් කැනීමේ කටයුතු සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. මෙම ව්‍යාපෘතිය සිදුකිරීම සඳහා ලැබී ඇති ලංසු ඇගයීම සිදුකරමින් පවතී. මෙම කටයුතු සිදුකරගෙන යන අතර තුර යෝජිත ව්‍යාපෘතිය සඳහා පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොවන බව පෙනීගිය හෙයින් ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් අක්කර 4ක ඉඩමක් ලබා ගැනීම සඳහා සාකච්ඡා කරමින් පවතී. මේ වන විට ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටලුව හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු නැවතී ඇත.

**vii) කුරුණෑගල තොග තෙල් ගබඩාව වැඩි දියුණු කිරීම**

හදිසි අනතුරකදී ගබඩා අංගනයන් තුළ තෙල් ආරක්ෂිත රැඳවීම සඳහා පවුරු බැමි ඉදි කිරීමටත්, නළ පද්ධතින් නිසියාකාරව ස්ථානගත කිරීමටත්, ගිනි නිවීමේ මධ්‍යස්ථාන ටැංකි අංගනයෙන් වෙන් කිරීමටත්, අවශ්‍ය වන්නා වූ විවේකාගාර පහසුකම් ලබාදීමටත්, ටැංකි ගබඩා සඳහා අවශ්‍ය වන්නා වූ ප්‍රවේශයන් සැකසීමටත්, ගැසොලීන් ග්‍රැන්ට්‍රිය කේන්ද්‍ර ගත කිරීම සඳහාත්, සම්මත කේතයන්ට සහ ප්‍රමිතීන්ට අනුව තොග තෙල් ගබඩාව ඉදිකිරීමටත් අවශ්‍ය බැවින් ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම කුරුණෑගල ඩිපෝව දියුණු කිරීමට තීරණයක් ගෙන ඇත.

2015.04.07 දින පැවති 14/140 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මේ සඳහා රුපියල් මිලියන 109.2ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලැබී ඇත. තට්ටු 3 ක විවේකාගාර ගොඩනැගිල්ල, ගිනි

පොම්පාගරය හා කාර්යාලීය ගොඩනැගිල්ල, ගැසොලීන් ගැන්ට්‍රිය, ගිනි පොම්ප ස්ථානගත කිරීමල යනාදිය සිදුකරමින් පවතී. පැති බැම්ම සහ නළ මාර්ග නිවැරදිව ස්ථාපනය, 2019 දී සිදු කිරීමට නියමිතය.

### viii) නව ඉන්ධන තොග ගබඩාවක් උතුරු පළාතේ ස්ථාපනය කිරීම

වර්තමානයේ උතුරු පළාතේ පවතින තෙල් තොග ගබඩාව කන්කසන්තුරේ සිමෙන්ති සංස්ථාව පිහිටි භූමියේ පිහිටා ඇති අතර සිමෙන්ති සංස්ථාව විසින් මෙම තෙල් තොග ගබඩාව එම ස්ථානයෙන් ඉවත් කර ගන්නා ලෙසට 2011 වර්ෂයේ දී ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම වෙත දන්වා ඇත. ඒ අනුව, අනිකුත් සියළු පහසුකම්වලින් සමන්විත ඩීසල් ස.මී.4500, පෙට්‍රල් ස.මී.2500, දැවිතෙල් ස.මී. 2500 හා භූමිතෙල් ස.මී.1000, ධාරිතාවයකින් යුතු නව තොග ගබඩාවක් ස්ථාපනය කිරීම සඳහා සුදුසු ඉඩමක් ලබා ගැනිම සඳහා ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් කටයුතු කරන ලදී.

**අපේක්ෂිත ප්‍රතිලාභ.**

- උතුරු පළාතේ අඛණ්ඩ තෙල් සැපයුම තහවුරු කිරීම.
- නියමිත පාරිසරික ආරක්ෂණ ක්‍රමවේද පිළිපැදීම.
- යුද්ධය නිමා වීමත් සමග උතුරු පළාතේ ආරම්භ කර ඇති සංවර්ධන වැඩසටහන් දියත්කිරීම සඳහා කර්මාන්ත කරුවන්ට අවශ්‍ය ඉන්ධන අඛණ්ඩව සැපයීමට හැකි වීම.
- දුම්රිය භාවිතය මගින් ඉන්ධන ප්‍රවාහන පිරිවැය අවම කිරීමට හැකි වීම.
- උසස් ගුණාත්මක භාවයෙන් යුතු ඉන්ධන අඛණ්ඩව සැපයීම තුළින් පාරිභෝගික විශ්වාසය දිනා ගත හැකි වීම.

කෙසේ වුවද ගරු අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි සිමෙන්ති සංස්ථාව පිහිටි භූමියේම අවශ්‍ය නවීකරණය හා පුළුල් කිරීම් සිදුකර අඛණ්ඩව ඉන්ධන ගබඩාව පවත්වාගෙන යාමට අවශ්‍ය සාකච්ඡා සිමෙන්ති සංස්ථාව සමඟ සිදුකරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ කන්කසන්තුරේ ප්‍රාදේශීය තොග ගබඩාව පිහිටා ඇති භූමිය ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට පවරා ගැනීම සඳහා අංක 16/1891/746/001-I සහ 2016-09-13 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කරන ලදී. එකී ඉඩමේ අයිතිය පිළිබඳව ගැටළුවක් පවතින බැවින් එම ගැටළු අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි විසඳීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. ඉඩම් කොමසාරිස්තුමා විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අදාළ ඉඩම බදු දීම සඳහා ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ඉල්ලා ඇත.

### ix) කොලොන්නාව නිමාව තුළ ටැංකි 17,18,19 22,23, හා 41 සඳහා අභ්‍යන්තර පාවෙන වහලයන් ස්ථාපනය කිරීම.

අදාල ක්ෂේතයන්ට හා ප්‍රමිතීන්ට අනුගත වෙමින් ගැසොලීන් ටැංකි සඳහා වාෂ්පීකරණ අවාසි අවම කිරිම සඳහා අභ්‍යන්තර පාවෙන වහලයන් ඉදි කිරිමට ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම තීරණය කර ඇත.

පළමු අදියර ලෙස ටැංකි අංක 18,19 හා 41 සඳහා රුපියල් 41,520,442.00+ බදු මුදලකට යටත්ව අභ්‍යන්තර පාවෙන වහලයන් ස්ථාපනය කර ඇත. දෙවන අදියර ලෙස 2018/2019 වර්ෂ වලදී ටැංකි අංක 17,22, සහ 23 සඳහා අභ්‍යන්තර වහලයන් ඉදිකිරිමට සැලසුම් කර ඇති අතර ඊට නියමිත ඇස්තමේන්තුගත මුදල රුපියල් 19,000,000.00+ බදු වේ.

මෙම සන්දර්භය තුළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා තාක්ෂණික ඇගැයීම් කමිටුවක් පත් කර ඇතග දෙපාර්මේන්තු ප්‍රසම්පාදන කටුව තාක්ෂණික ඇගැයීම් කමිටුව විසින් නිර්දේශ කරන ලද ලංසු පත්‍රිකාව අනුමත කර ඇති අතර ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය යටතේ මහජන ලංසු කැඳවන ලදී. 2018.05.31 දින ලංසු විවෘත කරන ලද අතර

සමාගම් දෙකක් මඟින් ලංසු ඉදිරිපත් කර ඇත. ඉදිරිපත් කරන ලද ලංසු ඉංජිනේරු ඇස්තමේන්තුවට සාපේක්ෂව ඉතා ඉහළ බැවින් නැවත ලංසු කැඳවීමට තීරණය කරන ලදී. ඒ අනුව නැවත ලංසු කැඳවීම සිදුකරමින් පවතී.

**x) කොලොන්නාව නිමාව තුළ කලාප අංක 01 සිට 4 දක්වා වු පැතිබැම්ම/වේල්ල ඉදිකිරීම**

කොලොන්නාව නිමාව තුළ කලාප 01 සිට 04 දක්වා වු පැතිබැම්ම/වේල්ල පස් කඩාවැටීම නිසා හානියට ලක්විණ. වැසි සමයේ දි මෙම පස් කඩා වැටීම් සිදු වූ අතර, ඒ නිසා පැති බැම්මෙහි අස්ථාවරවීම් දක්නට ලැබිණ. වැසි සමය තුළ තවදුරටත් වේල්ලෙහි ඛාදනය වීම මඟින් අසල්වැසි නිවැසියන්ට සහ ව්‍යුහයන්ට ඇතිවන හානී වැළැක්වීමටත්, ප්‍රදේශයේ ස්ථාවර තත්ත්වයක් ඇති කිරිමටත්, වේල්ලෙහි බැවුම් තත්ත්වයන් ස්ථාවරව සකස් කළ යුතු වේ.

මේ වන විට මෙම ව්‍යාපෘතියට අදාලව පූර්ව කොන්ත්‍රාත්තු ප්‍රසම්පාදන කටයුතු නිම කර ඇති අතර ගාමිණි කන්ස්ට්‍රක්ෂන් ආයතනයට අදාල ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ඇතිව රුපියල් 30,293,544.75+ බදු මුදලකට කොන්ත්‍රාත්තුව පිරිනමා ඇතග 2018 වර්ෂයේ මාර්තු මස මෙම කොන්ත්‍රාත්තුව ඉහත සඳහන් සමාගම විසින් සැලසුම් කළ ආකාරයට නිම කර ඇත.

**xi) කොලොන්නාව නිමාව තුළ කලාප 03 හි වැගන් පිරවීම සඳහා වු ගැන්ට්‍රියක් ස්ථාපනය කිරිම**

කොලොන්නාව නිමාව තුළ කලාප 03 හි පවත්නා වු ගුවන් යානා ඉන්ධන පිරිවුම් තත්ත්වය විවෘත පහසුකම් යටතේ පමණක් ක්‍රියාත්මක වේග අයහපත් කාලගුණික තත්ව තුළ මෙහි මෙහෙයුම් ක්‍රියාකාරීත්ව සිදු කිරිමට දැඩි බාධා ඇතිවේ. එබැවින් ගුවන් යානා ඉන්ධන වැගන් පිරවුම් මෙහෙයුම් වල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරිමට පහසුකම් සහිතව ගැන්ට්‍රියක් ඉදිකිරිමට ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම තීරණය කර ඇත. යෝජිත ගැන්ට්‍රිය දිගින් මීටර 57 ක්ද පළලින් මීටර 11 ක්ද වන අතර පුළුල් ඇවිදීම් වේදිකාවක් ද ඇතුලත්වේ. මෙම යෝජනාව ජෙට් ඒ - 1 සඳහා වු දුම්රිය ටැංකි පිරවුම් පහසුකම් ඇති කිරීම, යටිතල පහසුකම් සංවර්ධන කිරීම, ඕනෑම කාලගුණික තත්ත්වයක් යටතේ ක්‍රියාකරවුම් සේවකයන්ගේ මුලික අවශ්‍යතාවයන් සපුරා ලීම යන කරුණු කාරණා සපුරා ලීමට ගන්නා ලද පියවරකිග ව්‍යාපෘතිය සඳහා වු ඇස්තමේන්තු ගත මුදල රුපියල් මිලියන 30 ක් වන අතර ව්‍යාපෘති කාලසීමාව මාස 06කි.

මේ වන විට ප්‍රසම්පාදන කටයුතු නිමකර ඇති අතරල අදාල ප්‍රසම්පාදන කමිටු අනුමැතිය යටතේ ලාෆ්ස් ඉංජිනේරු සමාගමට රුපියල් 28,423,215.40+ බදු මුදලකට පිරිනමා ඇත. 2018.06.04 වන දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද අතර, මේ වන විට සිවිල් ඉදිකිරීම් කටුයතු අවසන් කර ඇත. වර්තමානය වන විට ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතින අතර ව්‍යාපෘතියෙන් සියයට 60ක වැඩ නිම කර ඇත.

**xii) කොලොන්නාව නිමාව තුළ පවතින ටැංකි අංක 03 සහ ටැංකි අංක 04 අළුත් වැඩියා කිරිම.**

වර්ෂ 1999 දි ටැංකි අංක 03, 04 සහ 05 ඉදිකර ක්‍රියාත්මක තත්ත්වයට පත් කර ඇත. මෙම ටැංකි නිරන්තර අධීක්ෂණයට ලක් කරන ලද අතරල මෑත ඉතිහාසයේ මෙහි වහලයන් තුළ විඛාදනය හා කුහර ඇති බව නිරීක්ෂණය කරන ලදිග එබැවින් 2017 වර්ෂයේදි ටැංකි අංක 05 හි වහල තහඩු නැවත යොදා ප්‍රතිසංස්කරණය කරන ලදි.

ටැංකි අංක 03 හා 04 හි වහල තහඩු ප්‍රතිසංස්කරණය කටයුතු 2018/2019 වර්ෂවල දී නිම කිරිමට සැලසුම් කර ඇත. මෙහෙයුම් අවශ්‍යතාවයන් සලකා බලා ටැංකි අංක 04

ප්‍රථමයෙන් ප්‍රතිසංස්කරණය කිරිමට තිරණය කර ඇති අතරල ඉන් පසුව ටැංකි අංක 03 හි ප්‍රතිසංස්කරණ කටයුතු කිරිමට නියමිතය.

මෙම සන්දර්භය මෙම ප්‍රසම්පාදන කාර්යය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කරන ලද අතර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මගින් ටැංකි අංක 04 ට අදාල ලංසු පත්‍රිකාව සඳහා අනුමැතිය ලබාදෙන ලදිග ඉංජිනේරු ඇස්තමේන්තුගත මුදල රුපියල් 39,788,500.00+ බදු වේ. ව්‍යාපෘති කාලය මාස 7කි.

පූර්ව කොන්ත්‍රාත්තු ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ප්‍රසම්පාදන කමිටු අනුමැතිය යටතේ රු.36,040,408.68 + බදු මුදලකට Walker Sons & Company Engineers (Pvt) Ltd ආයතනය වෙත කොන්ත්‍රාත්තුව පිරිනමන ලදී. ටැංකි අංක 4 හි කටයුතු 2018.10.04 දින ආරම්භ කරන ලද අතර 2019ග05ග04 අවසන් කිරීමට නියමිතය. වර්තමානය වන විට සියයට 25 ක වැඩ අවසන් කර ඇත.

**xiii)කොලොන්නාව නිමාව තුළ අංක 46 අළුත්වැඩියා කිරිම**

වර්ෂ 2007 සිදු වු ගුවන් ප්‍රහාරයෙන් ටැංකි අංක 46 හි වහල තහඩුල වහල ව්‍යුහය හා ඉහළ මට්ටමේ ෂෙල් තහඩු 03 ක් හානියට ලක්ව ඇත. ඒ අවස්ථාවේ තාවකාලිකව අළුත්වැඩියා කටයුතු සිදු කරන ලද අතර මේ වනතෙක්ම මෙහෙයුම් නටයුතු සඳහා භාවිතා කරමින් පවතී. මේ වන විට හානියට පත් ප්‍රදේශවල මලබැඳීම හේතුවෙන් විශාල වශයෙන් අළුත් වැඩියාවන් අවශ්‍ය වෙමින් පවතී. මෙහි අළුත්වැඩියා කටයුතුල පඩිපෙළෙහි වු අත් වැට නැවත සකස් කිරිමල අවශ්‍ය පිරිසිදු කිරිමෙන් පසු ටැංකියෙහි තීන්ත ආලේපනය කිරිම හා භූගත සම්බන්ධ කිරිම් ඇතුලත් වේ. මෙම ව්‍යාපෘතිය සඳහා වු ඇස්තමේන්තුගත මුදල රුපියල් 148,014,607.00 වන අතර ව්‍යාපෘති කාල සීමාව මාස 10 කි. අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය 2015.06.21 දින 11/185 යටතේ ලැබී ඇත. ලංසු කැඳවීමේ ලේඛනය සකස් කර ඇති අතර අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා ගැනීමට නියමිතය.

**xiv)කොලොන්නාව නිමාවේ කලාප 05 සහ 06 තුළ පිහිටා ඇති ටැංකි රථ හා බෝගී පිරවුම් ක්‍රියාවලිය වැඩිදියුණු කොට නවීකරණය කිරිම**

වර්ෂ 1962 ට පෙර කොලොන්නාව නිමාව තුළ ඉන්ධන බෙදාහැරිමේ කටයුතු කැල්ටෙක්ස්, එසෝ සහ ෂෙල් පුද්ගලික ආයතන 03 මගින් මෙහෙයුම් කර ඇත. 1962 වර්ෂයෙන් පසුව මෙම සමාගම් තුනේ මෙහෙයුම් කටුයතු එකක් ලෙස ස්ථාපිත වී විවිධ වර්ගයේ ඉන්ධන නිෂ්පාදනයන් වෙන වෙනම ස්ථානවල ගබඩා කර තිබු අතර, ඒවා කලාපවලට ගැලපෙන සේ යෝග්‍යතාවයන් සහ වර්ගීකරණයන් සිදු නොකොට මෙහෙයුම් කටයුතු සිදු කර ඇත. එම හේතුව නිසා ක්‍රියාකරවුම් අංශ සහ ඉංජිනේරු අංශය එක්ව ඉන්ධන මෙහෙයුම් පද්ධතීන් ප්‍රමිතිගත කිරිමට සහ දැනට පවතින ක්‍රියාදාමයන් ඇගැයීමකට ලක්කොට ඒවා ජාත්‍යාන්තර ප්‍රවේසම් ප්‍රමිතීන් සහ කේතයන්ට අනුකුලව වැඩි දියුණු කිරිමට ක්‍රියා කරන ලදි. දැනට පවතින ටැංකි අංගනය, නළ පද්ධති සහ පෙට්‍රල් පොම්පාගාරය ගොඩනගා ඇත්තේ ඉන්ධන බෙදාහැරීමේ කටයුතුවලට අවශ්‍ය ආරක්ෂක හා අනෙකුත් ප්‍රමිතීන්වලට අනුකුලව නොවේ. ගබඩා පහසුකම් වැඩි දියුණු කිරිමේදි ප්‍රධානතම අවශ්‍යතාවයක් වන්නේ අවශ්‍ය වන ආරක්ෂක ප්‍රමිතීන් අනුග මනය කිරිමයි.

මෙහෙයුම් ක්‍රියාදාමයට අත්‍යාවශ්‍ය පහසුකම් හදුනාගැනිමේදි ඒවායේ ප්‍රවේසම් තත්ත්වයන් සනාථ කොට නොමැති බැවින් කලාප 05 සහ 06හි ටැංකි රථ සහ බෝගී රථ පිරවීමේ පද්ධතිය නවීකරණය කොට වැඩි දියුණු කිරීමට ද එහි නළ පද්ධතිය වැඩි දියුණු කිරීමටද, ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම තීරණය කරන ලද අතර, ඒ සඳහා සම්පූර්ණ ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 170කි.

මෙම ව්‍යාපෘතියට අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත ලාෆ් ඉංජිනේරු පෞද්ගලික සමාගම වෙත රුපියල් 36,724,158.00 + බදු මුදලකට පිරි නමා ඇත. කොන්ත්‍රාත්තු කාලය මාස 6කි. 2018.06.04 දින පොම්පාගාරගය ගොඩනැගිමේ කටයුතු ආරම්භ කරන ලදී. මේ වන විට ව්‍යාපෘතියේ කටයුතු සියයට 50ක් අවසන් කර ඇත. නළ පද්ධතිය සවිකිරීමේ කාර්යය සිදුකිරීමට නියමිතව පවතී.

**xv) කොලොන්නාව තෙල් ගබඩා පර්යන්තය සහ මුතුරාජවෙල තෙල් ගබඩා පර්යන්තය සහ එයට අයත් පාවෙන බෝයාව යා කිරීමේ ව්‍යාපෘතිය සඳහා සක්‍යතා අධ්‍යයනය සිදුකිරීම.**

ලංකාවේ ප්‍රධානතම තෙල් බෙදාහැරීමේ නියමුවා වශයෙන් අපගේ ප්‍රධානතම අරමුණ වන්නේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියන් ඔයිල් සමාගමට බාධාවකින් තොරව මහජනතාව වෙත ඉල්ලුමට අනුකූලව සැපයුම ලබාදීමයි. මේ සඳහා අපගේ තෙල් ගබඩා පර්යන්ත දෙකෙහිම මෙහෙයුම් කටයුතු නම්‍යශීලීව සහ කාර්යක්ෂමව සිදු කළ යුතුව ඇත. ඉන්ධන ධාරිතාව වැඩි දියුණු කිරීමේ කටයුතුවල දී මුතුරාජවෙල පර්යන්තයත්, කොලොන්නාව තෙල් ගබඩා පර්යන්තයත්, මුතුරාජවෙල පර්යන්තයේ පාවෙන බෝයාවත් එකට යා කිරීමේ කටයුතු සිදු කළ යුතු අතර, මුතුරාජවෙල පර්යන්තයට නව බෝයාවක් ස්ථාපිත කිරිම කලයුතුය. මෙමගින් ආර්ථික වශයෙන් වඩා ඵලදායි සහ කාර්යක්ෂමව සේවාවක් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයෙන අතර, එය අප සමාගමේ අපේක්ෂාව සඵල කිරීමට ඉවහල් වේ.

මේ සඳහා වන අමාත්‍යමණ්ඩල අනුමැතිය 2012.08.29 දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 12/1150/510/022/TBR යටතේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහ 2015.04.07 දින 12/140 වන පත්‍රිකා අංක 10 යටතේ ලැබී ඇත.

මේ සන්දර්භය තුළ තාක්ෂණික ඇගැයීම් කමිටුව (TEC) නම් කරන ලද අතර, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමට ඒ සඳහා පත් කරන ලද අමාත්‍යාංශ ප්‍රසම්පදාන උපදේශන කමිටුව (CPCM) මගින් කැමැත්ත පළකිරීමේ ප්‍රකාශය සහ යෝජනා කැඳවීමේ ලේඛණය සඳහා අනුමැතිය ලැබී ඇත. ප්‍රසම්පාදන කමිටුව විසින් ජාත්‍යන්තර තරගකාරී ප්‍රසම්පාදන ක්‍රමය යටතේ කැමැත්ත පළ කිරීමේ ප්‍රකාශ කැඳවන ලදී. 2018.08.14 දින ලංසු විවෘත කරනු ලැබූ අතර ලංසු 18ක් ලැබී තිබුණි. එම ලංසු අතරින් තෝරගනු ලැබූ අතර ප්‍රසම්පාදන කමිටු නිර්දේශය ලංසු 7ක් මත යෝජිත කැඳවීමේ ලේඛන එම උපදේශන සමාගම් වෙත යවන ලදී පූර්ව ලංසු සාකච්ඡාව 2018.10.29 දින පවත්වන ලද අතර යෝජනා කැඳවීම 2018.12.17 දිනෙන් අවසන් විය. සමාගම් 07න් සමාගම් 05ක් යෝජනා ඉදිරිපත් කර තිබූ අතර මේ වන විට තාක්ෂණික යෝජනා ඇගයීම් කරමින් පවතී.

**xvi) මුතුරාජවෙල තෙල් ගබඩා පර්යන්තය සඳහා නව පොම්පාගාරයක් නිර්මාණය කර ඉදි කර මෙහෙයුම් කටයුතුවලට ලබාදීම සහ දැනට පවතින ගැන්ට්‍රි දිගුවක් ඇති කර එයට අදාල අනෙකුත් පහසුකම් වැඩි දියුණු කිරීම මගින් ටැංකි රථ පිරවීමේ ධාරිතාව වැඩි කිරීම.**

ශ්‍රී ලංකාවේ ඉන්ධන අවශ්‍යතාවය වාර්ෂිකව 4-5% ක සාමාන්‍ය අගයකින් ඉහළ යයි. එබැවින් එයට සරිලන බෙදාහැරීමේ පහසුකම් වැඩි දියුණු කර ඉන්ධන හිඟයක් රට තුළ නිර්මාණය වීම වැලැක්වීමට පියවර ගතයුතු වේ. එසේම ප්‍රධාන පර්යන්ත දෙකෙහිම නඩත්තු කිරිම හෝ වෙනත් ඕනෑම ගැටළුකාරී අවස්ථාවක ඇති විය හැකි අතිරේක ඉල්ලුම සපුරාලීමට ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදනය බෙදාහැරිමේ පහසුකමට අතිරේකව බෙදාහැරීමේ ධාරිතාවයන් වැඩිවිය යුතුය. එබැවින් රටතුළ ඛනිජ තෙල් බෙදාහැරීමේ කටයුතු වඩාත් සුමට හා අඛණ්ඩව සිදු කිරීමට තෙල් බෙදාහැරිමේ පහසුකම් වැඩිදියුණු කිරිම අත්‍යාවශ්‍ය වේ.

මෙම කටයුත්තට මුල පිරිමක් ලෙස ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, ඉන්ධන බෙදාහැරීම පුළුල් කිරීමට තීරණය කරනු ලැබූ අතරල ඒ සඳහා 2016 සිට 2030 දක්වා ඉන්ධන ඉල්ලුම වැඩිවීමේ ප්‍රවණතාවය සපුරාලීම සඳහා පියවර ගෙන මුතුරාජවෙල පර්යන්තයේ දැනට පවතින බෙදාහැරීමේ පහසුකම් උපරිම අයුරින් භාවිතයට ගනිමින් ඒවා වැඩි දියුණු කිරීමත් ඒ සඳහා දැනට පවතින ගැන්ට්‍රියට අමතරව පිරවුම් ප්‍රවේශයන් 8ක් එක් කිරිමද, නව පොම්පාගාරයක් ලබා දී පහසුකම් වැඩිදියුණු කිරිමද අයත් වේ. මේ සඳහා ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 550 කි. මෙය අධ්‍යක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කිරිමෙන් අනතුරුව 2018.08.29 දින අනුමැතිය ලැබුණු අතරල මාස 12කින් ව්‍යාපෘතිය නිම කිරිමට ඉලක්ක කර ඇත්තේ අවශ්‍ය වන ඉන්ධන බෙදාහැරීමේ හැකියාව වැඩිවන ඉල්ලුමට අනුව සපුරාලීමටත් මෙය ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ ප්‍රමුඛතම ව්‍යාපෘතියක් වන බැවිනි.

මෙම සන්දර්භය තුළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමට තාක්ෂණික ඇගැයීමේ කමිටුවක් පත් කරන ලද අතර, ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලැබූ ලංසු කැඳවීමේ ලිපි ලේඛණ අමාත්‍ය මණ්ඩල නම් කල ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරන ලදී. මෙම කමිටුවේ සභාපතිතුමා විසින් ලියුම් කවර දෙකේ ක්‍රම වේදය භාවිතා කර ගනිමින් අන්තර්ජාතික තරගකාරීත්වයෙන් යුත් මහජන ලංසු තබන්නන් හට ආරාධනා කරන ලදී. තාක්ෂණික ලංසු 2018.04.26 දින විවෘත කරන ලද අතර ආයතන 05 ක් තම ලංසු ඉදිරිපත් කොට තිබුණි. තාක්ෂණීක ලංසු ඇගැයීමේ කටයුතු අවසන් වූ පසු අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කරනු ලැබූ තාක්ෂණික සුදුසුකම් සපුරා තිබූ ලංසු පමණක් 2018.08.03 දින විවෘත කරන ලදී. මූල්‍යමය ලංසු ඇගයීමෙන් පසු ප්‍රසම්පාදන පරීක්ෂාකරණ කමිටුව විසින් 2018.09.10 දින පැවති රැස්වීමේ දී due diligence ලෙස තීරණය කරන ලදී. එම වාර්තාව 2018.10.03 දින ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලැබීමට නියමිතයි.

**xvii)මුතුරජවෙල ටැංකි අංක 6,7 සහ 8 සඳහා අභ්‍යන්තර පාවෙන වහලවල් සැලසුම් කිරිම නිෂ්පාදනය කිරිම, සැපයීම, ස්ථාපනය කිරිම, පරික්ෂා කිරිම සහ සවි කිරිම**

2015 වර්ෂයේ දී පෙට්‍රල් සඳහා වූ වර්තමාන ඉල්ලුම සපුරාලීම සඳහා පෙට්‍රල් ගබඩා කිරීමේ ධාරිතාවය වැඩි කිරිමට ගබඩා කිරීමේ ටැංකි, නළ මාර්ග පද්ධති සහ අනෙකුත් අනුග්‍රාහක පද්ධතින් වැඩි දියුණු කිරිම සඳහා ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම මුතුරාජවෙල පර්යන්තයෙන් අනෙකුත් නිෂ්පාදනවලින් අතිරේක 30,000$m^3$ක ධාරිතාවක් ලබා ගැනීමට තීරණය කර ඇත. දැනට ඩීසල් ගබඩා කරන ලද ටැංකි අංක 6,7සහ 8 ඊට වඩාත් යෝග්‍ය ලෙස හඳුනාගෙන ඇති අතර, එම ටැංකි පෙට්‍රල් ටැංකිවලට යාබදව පිහිටා ඇති බැවින් නළ පද්ධතිය නවීකරණය අවම වෙනස් වීම් සහිතව සිදු කිරිමට නියමිතය. වාෂ්පීකරණය පාලනය කිරිම සඳහා පීඩන වැකුම් වැල්ව මෙම ටැංකි සඳහා සවි කර ඇත.

වර්තමානයේ පවතින නිෂ්පාදන අහම්වීම සහ පාඩු අවම කිරීම සඳහා ආරක්ෂිත පියවර වැඩි කිරිමට ඉහත වැඩි දියුණු කරන ලද ටැංකි සඳහා අභ්‍යන්තර පාවෙන වහලවල් සවි කිරිම අවශ්‍ය වේ. මේ සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 70 කි.

ටෙන්ඩර් ක්‍රියාමාර්ගයන්ට අනුකූලව දැනටමත් ටැංකි අංක 6, 7 සහ 8 සඳහා රුපියල් මිලියන 46 ක පිරිවැයක් යටතේ නිෂ්පාදිත අභ්‍යන්තර පාවෙන වහලවල් ගෙන්වා ඇත.

දැනට පෙර කොන්ත්‍රාත් ප්‍රසම්පාදනය කටයුතු සම්පූර්ණ කර ඇති අතර අදාල ප්‍රසම්පාදන

කම්ටුවේ අනුමැතිය යටතේ කොන්ත්‍රාත් මුදල් රු17,424.268+ බදු මුදලකට යටත්ව ලාෆ්ස් ඉංජිනේරු පුද්ගලික සමාගමට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී. කොන්ත්‍රාත්තුව 2017.08.07 දින ආරම්භ කරන ලද අතර මේ වන විට සියයට 30ක වැඩ නිම කර ඇත.

# 6. ඛනිජතෙල් ගවේෂණය සහ සංවර්ධනය

### 6.1 6.1 නැගෙනහිර වෙරළ තීරයේ සිදු කෙරෙන ඒකාබද්ධ අධ්‍යයන වැඩසටහන (JS5 සහ JS6 බිම් කොටස්)

ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තිරයේ අධික ගැඹුරකින් යුත් JS 5 සහ JS 6 බිම් කොටස් වල ගවේෂණ කටයුතු සඳහා 2016 පෙබරවාරි 18 දින ශ්‍රී ලංකා රජය සහ ප්‍රංශයේ විශාලම තෙල් සමාගම වන ටොටාල් සමාගම ඒකාබද්ධ ගවේෂණ ගිවිසුමකට එළඹෙන ලදී. ඊස්ටර්න් ඊකෝ ඩී එම් සී සී (Eastern Eco DMCC) සමාගම ටොටාල් සමාගමේ බහුසේවා කොන්දේසි යටතේ දත්ත එකතු කරනු ලබන හවුල්කරු වන අතර ටොටාල් (TOTAL) සමාගලම වෙනුවෙන් ඒකාබද්ධ අධ්‍යයන ප්‍රදේශය ආවරණය කරමින් ද්විමාන භූකම්පන දත්ත රැස්කිරීමේ කාර්යයට දායක වෙයි. 2018 මැයි 30 දින ශ්‍රී ලංකා රජය සහ ඊස්ටර්න් ඊකෝ ඩී එම් සී සී සමාගම අතර දත්ත එක්රැස් කිරීමේ බහුසේවාදායක ගිවිසුමට එළඹ ඇති බැවින් මෙම ව්‍යාපෘතියේ කටයුතු 2018 සැප්තැම්බර් මාසයේ දී ආරම්භ කරන ලදී. මේ සම්බන්ධයෙන් වන විද්වතුන් මෙරටට පැමිණි අතර 2018 සැප්තැම්බර් 02 දින නිළ සමාරම්භක උත්සවය කොළඹ වරායේදී පවත්වන ලදී. කි.මී. 5000ක් ආවරණය වන පරිදි නැගෙනහිර වෙරළේ ද්විමාන දත්ත රැස්කිරීම 2018 සැප්තැම්බර් 03 දින ආරම්භ කරන ලදී. මෙම දත්ත රැස්කිරීම 2018 නොවැම්බර් මාසය වන විට අවසන් කරන ලද අතර මේවන විට දත්ත සකස්කරමින් පවතී.

### 6.2 ස්වභාවික වායු වානිජමය වශයෙන් නිපදවීම (මන්නාරම් ද්‍රෝණියේ එම් 2 බිම් කොටස

2017 වසරේදී මෙම බිම් කොටස සඳහා අයි එච් එස් ග්ලෝබල් සමාගමේ (IHS Global) සහය ඇතිව දියත් කෙරුනු අළෙවි ප්‍රවර්ධන වැඩසටහන සාර්ථකව අවසන් කොට ඇත. ලංසු කැඳවීමේ ලිපිලේඛන ව්‍යාපෘති කමිටුවට සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රමන්ත්‍රණ කමිටුව වෙත එහි විමර්ශනයට සහ අනුමැතියට ලබාදී ඇති අතර අනුමැතිය ලද පසු එම් 2 බිම්කොටස සංවර්ධනය සඳහා ආයෝජකයෙකු තෝරා ගැනීම සඳහා ගෝලීය වශයෙන් ලංසු කැඳවීමට සැලසුම් කර ඇත. තෙල් කැනීම් ක්ෂේත්‍රයේ ගෝලීය වශයෙන් ප්‍රසිද්ධ සමාගම් කිහිපයක් මෙම නිධි සංවර්ධනය කිරීමට කැමැත්ත ප්‍රකාශ කර ඇත. එසේම නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය සමීපයේ මෙ.වො. 300 ක ධාරිතාවයකින් යුත් ද්‍රව ස්වභාවික වායු බලාගා රයක් ස්ථාපනය කිරීම දීර්ඝකාලීන විදුලිබල උත්පාදන සැලැස්මට ඇතුළත් කිරීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය සමඟ සාකච්ඡා කරමින් පවතී. කෙසේ වෙතත්, මෙම ලංසු වටය හරහා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලයේ මුඛ්‍ය සැලසුම වන්නේ එම් 2 බිම් කොටසේ තවදුරටත් ගවේෂණ කටයුතු සඳහා දිරි ගැන්වීමයි. ඒ අනුව සිදුකෙරෙන පරීක්ෂණ සහ ගවේෂණ කටයුතු මගින් මුළු බිම් කොටසේම ඛනිජතෙල් සහ ස්වභාවික වායු තිබීමේ හැකියාව පිළිබඳ සාක්ෂි තහවුරු කරගැනීමට තෝරා ගත් ආයෝජකයාට අවස්ථාව හිමිවේ. ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලයේ ඉලක්කය වනුයේ 2023 වන විට මෙරට ගෑස් නිෂ්පාදනය කිරීමයි. මීට අදළ ලංසු කැඳවීම 2019 ජනවාරි පළමු සතියේ දී සිදුකිරීමට නියමිතය.

### 6.3 ස්ලම්බර්ජර් (Schlumberger) බහුසේවා කොන්දේසි යටතේ ස්ලම්බර්ජර් සමාගම විසින් සිදුකරන දත්ත රැස්කිරීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා රජය සහ ඊස්ටර්න් ඉකෝ ඩී එම්

සී සී අතර බහු සේවා කොන්දේසි යටතේ සිදුකෙරෙන දත්ත රැස්කිරීමේ ව්‍යාපෘතියට අදළ ගිවිසුමට 2018 මැයි 30 දින එළඹෙන ලදී. ඊස්ටර්න් ඉකෝ ඩී එම් සී සී සමාගම යනු ලොව ප්‍රමුඛතම තෙල් සමාගම වන ස්ලම්බර්ජර් සමාගමට (Schlumberger) මුළු හිමිකාරීත්වය ඇති උප සමාගමකි. මෙම ව්‍යාපෘතිය 2018 සැප්තැම්බර් 03 දින ශ්‍රී ලංකාවේ නැගෙනහිර අක් වෙරළ තීරයෙන් ආරම්භ කැන ලද අතර ටොටාල් සමාගම විසින් සිදුකරන ද්විමාන දත්ත එක්රැස් කිරීමේ කාර්යය අවසන් කළ පසු ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ තීරයට පැමිණෙන ලදී. ශ්‍රී ලංකාවේ අක් වෙරළ තීරයේ ද්විමාන හා ත්‍රිමාන දත්ත රැස්කිරීමේ කාර්යය වෙනුවෙන් මෙම ව්‍යාපෘතිය යටතේ ඇ.ඩො. මිලියන 50කට වැඩි ප්‍රමාණයක් ආයෝජනය කිරීමට නිමිතය. ශ්‍රී ලංකාවේ අක්වෙරළ තීරයේ ඛනිජතෙල් ගවේෂණ සහ නිෂපාදන කටයුතුවල යෙදීමට අපේක්ෂා කරන ආයෝජකයින් ආකර්ශනය සඳහා ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලයේ දත්ත ගබඩාව වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘයේ ප්‍රධාන අරමුණයි. මෙහි දී පහත සඳහන් අයුරින් දත්ත රැස්කිරීම සිදු කරන ලදී.

| | | |
|---|---|---|
| JS5 & JS6 | - | 5000 lkm. |
| කාවේරි ද්‍රෝණිය | - | 250 lkm. |
| ලංකා ද්‍රෝණිය | - | 500 lkm. |
| මන්නාරම් ද්‍රෝණිය | - | 2500 lkm. |

## 6.4 M1 සහ C1 බිම් කොටස් වල ඛනිජ තෙල් ගවේෂණය

ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය සහ විදේශීය භූ විද්‍යා විශේෂඥයින් කිහිපදෙනෙක් එක්වී සිදුකළ ඛනිජතෙල් පද්ධති අනුරූප වන විශ්ලේෂණය කිරීමේදී M1 සහ C1 බිම් කොටස් පිහිටා ඇති භූමි ප්‍රදේශයේ ඛනිජතෙල් සහ ස්වභාවික වායු තිබීමේ හැකියාව ඉහළ මට්ටමක පවතින බව තහවුරු වී ඇත. එබැවින්, මෙම බිම් කොටස් දෙකේ ඛනිජතෙල් ගවේෂණය සඳහා යෝජනාවක් ප්‍රසිද්ධ සමාගමක් වෙතින් ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලයට ලැබී ඇත. ශ්‍රී ලංකාවට ලැබෙන ප්‍රතිලාභ තවදුරටත් වර්ධනය කිරීමේ අරමුණින් මෙකී බිම්කොටස් දෙක ගවේෂණය සඳහා වඩාත් විනිවිධභාවයෙන් යුත් ප්‍රසම්පාදන ක්‍රමවේදය වන තරගකාරී ලංසු ජාත්‍යන්තර වශයෙන් තරගකාරී කැඳවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව, ප්‍රම්පාදන ක්‍රියාවලිය සිදුකරමින් පවතී.

## 6.5 ශ්‍රී ලංකාවට හිමි මුහුදු කලාපය ආශ්‍රිව සිදු කෙරෙන සමුද්‍රීය පාරිසරික දත්ත රැස්කිරීමේ අධ්‍යයනය

සමුද්‍රීය පාරිසරික දත්ත එකතු කිරීමේ අධ්‍යයන ව්‍යාපෘතිය ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය විසින් ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජ්‍ය ආයතනයේ සහයෝගීතාවය ඇතිව ආරම්භ කරන ලදී. සමුද්‍රීය ප්‍රදේශ ඉලක්ක කරගෙන දීප ව්‍යාප්තව සමුද්‍රීය පාරිසරික දත්ත එකතු කිරීම සඳහා වන පර්යේෂණ ව්‍යාපෘතියක් ලෙස මෙය සැලකේ. ඛනිජතෙල් ගවේෂණ කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරුවක් ක්‍රියාවට නැංවීම පූර්ව අවශ්‍යතාවයකි. NARA ආයතනය දැනටමත් ව්‍යාපෘතිය අවසන් කර අවසන් වාර්තාව ලබා දී ඇති අතර වෙබ් අඩවිය කඩිනමින් දියත් කිරීමට නියමිතය. ශ්‍රී ලංකාවට අයත් මුහුදු තිරයේ හයිඩ්‍රෝකාබන් ගවේෂණය කිරීමට අපේක්ෂා කරන ඕනෑම සමාගමකට කාලය අඩුකර ගැනීමේ වාසි මෙම දත්ත පද්ධතියෙන් හිමිවේ. මෙවැනි තාක්ෂණිකව උසස් මට්ටමක පවතින ඍජු ක්‍රමයක් තිබීම ආයෝජකයන්ගේ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය වේගවත් කරන අතර, සියළු සේවා එක් වහලක් යටින් ලබා ගැනිමට හැකිවීම ඊට හේතුවයි.

## 6.6 ශ්‍රී ලංකාවේ ගොඩබිමේ සහ අක්වෙරළ තීරයේ ගුවන්ගතව සිදුකෙරෙන ගුරුත්ව සහ චුම්භක සමීක්ෂණය

ශ්‍රී ලංකාවේ ගොඩබිමේ සහ අක්වෙරළ තීරයේ ගුවන්ගතව සිදුකෙරෙන ගුරුත්ව හා චුම්භක සමීක්ෂණය සඳහා යෝජනා 4ක් ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලයට ලැබී ඇති අතර මෙයද බහුසේවා දායක දත්ත රැස්කිරීමේ ව්‍යාපෘතියකි. මෙම ගුවන්ගතව සිදුකෙරෙන ගුරුත්ව සහ චුම්භක සමීක්ෂණ අක්වෙරළ ප්‍රදේශවලට අමතරව ගොඩබිම් ප්‍රදේශ සහ යාපනය, ආඩිගම සහ තබ්බෝවද ඉලක්ක කොට සිදුවෙයි. එබැවින් මෙවන් විවිධාංගීකරණ උපාය මාර්ග අනුගමනය කිරීම ශ්‍රී ලංකාවට විදේශීය ආයෝජන ආකර්ෂණය කරගැනීමට බෙහෙවින් ම ඉවහල් වේ. මෙම යෝජනා හතර ඇගයීමේ කටයුතු අවසන් කර ඇති බැවින් බහුසේවා දායක දත්ත රැස්කිරීමේ කොන්ත්‍රාත්තුව පිරිනැමීමට අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රමන්ත්‍රණ කමිටුවේ අනුමැතිය ලබාගැනීමට නියමිතය.

# 7. ප්ලාස්ටික් අපද්‍රව්‍යවලින් ඉන්ධන නිපදවීම

මධ්‍යම පරිසර අධිකාරිය, මොරටුව විශ්ව විද්‍යාලය හා නවෝත්පාදක ආනන්ද විතානගේ මහතා එක්ව 2009 පෙබරවාරි මාසයේදි ත්‍රෛපාර්ශවික ගිවිසුමකට එළඹීමෙන් ප්ලාස්ටික් අපද්‍රව්‍යවලින් නිපදවන "පොලිප්ටෝ ලංකා" කර්මාන්ත ශාලාව ස්ථාපිත කරන ලදී. ඉවතලන ප්ලාස්ටික් අපද්‍රව්‍යවලින් ඉන්ධන නිපදවීමේ ක්‍රියාවලිය පිළිබඳ තාක්ෂණය ලොව පුරා ප්‍රචලිතව නොතිබූ බැවින් බලධාරීන්ගේ තිබූ සියළු අවිනිශ්චිතතා මගහරිමින් 2014 මැයි 07 දින අර්ධ වාණිජ යන්ත්‍රාගාරයේ පළමු රාශී බලගැන්වීම ඉතා සාර්ථකව නිම කරන ලදි. අනතුරුව නිෂ්පාදනය කරන ලද ද්‍රව ඉන්ධන සහ වායු ඉන්ධන සඳහා කාර්මික තාක්ෂණ ආයතනය මගින් තත්ත්ව සහතිකයක් ලබා ගත් අතර එම දත්තයන් විශ්ලේෂණය කිරීමේ දී ඉතා සතුටුදායක ප්‍රතිඵල ඇති කරගෙන ඇති බව අනාවරණය විය. මෙවැනි යන්ත්‍රාගාරයකට අවශ්‍ය මූලික ආරක්ෂණ විධික්‍රම ශක්තිමත් කරන තෙක් වැඩිදුර මෙහෙයුම් කිරීම තාවකාලිකව නතර කරන ලදී. මෙම අර්ධ වාණිජ යන්ත්‍රාගාරය මගින් වසරකට ඉවතලන අපිරිසිදු ප්ලාස්ටික් මෙ.ටො. 750ක් පමණ ඉන්ධන බවට පරිවර්තනය කිරීමට අපේක්ෂා කරන අතර වාණිජ තත්ත්වයේ යන්ත්‍රාගාරය පිහිටුවීමෙන් පසුව ඒ මගින් වසරකට ඉවතලන ප්ලාස්ටික් මෙ.ටො.6000ක් පමණ ඉන්ධන බවට පරිවර්තනය කළ හැකි බවට අපේක්ෂා කරන ලදී. 2011 සිට 2018 දක්වා භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති අරමුදල් පිළිබඳ විස්තර පහත 7.1 වගුව මගින් පෙන්වයි.

7.1 වගුව — භාණ්ඩාගාරය විසින් පොලිප්ටෝ ලංකා (පුද්) සමාගම වෙත ලබා දී ඇති අරමුදල්

| වර්ෂය | රු. මිලියන |
|---|---|
| 2011 | 17.2 |
| 2012 | 38.2 |
| 2013 | 20.0 |
| 2014 | 50.0 |
| 2015 | 50.0 |
| 2016 | 55.0 |
| 2017 | 29.25 |
| 2018 | 20.4 |
| **එකතුව** | **280.05** |

2015 සැප්තැම්බර් මස 03 වන දින අර්ධ වාණිජ යන්ත්‍රාගාරය බලගන්වන ලදි. ලාංකීය ඉංජිනේරු තාක්ෂණයේ සහ ලාංකීය නිර්මාණකරණයේ සුවිශේෂී මං සළකුණක් ලෙස මෙම නිර්මාණය සැළකිය හැකිය. තවද, මෙම යන්ත්‍රාගාරය දේශීය වශයෙන් සැලසුම් කොට නිර්මාණය කරන ලද අංගෝපාංග 31ක් සමන්විත වන අතර මේ සෑම කොටසක්ම මෙහෙයුම් කිරීමට ප්‍රථම පරීක්ෂාවට ලක්කරන ලදී. මේ හා සැසඳිය හැකි වෙනත් යන්ත්‍රාගාරයක් කිසිදු රටකින් සොයා ගැනීම ද අසීරු කාරණයක් වනු ඇත.

මෙහෙයුම් ක්‍රියාවලිය තුළ දී ඇතිවූ ප්‍රායෝගික ගැටළුකාරී තත්ත්වයක් මගහරවා ගනිමින් ක්‍රියාවලිය ඉදිරියට කරගෙන යාමට හැකියාව ලැබුණි. 2017 අවසන් වන විට ඉන්ධන ලීටර 65,215ක් නිපදවීමටත් එතුළින් රු. 2.661.540 ක ආදායමක් උත්පාදනය කිරීමටත් හැකියාව ලැබුණි. ප්ලාස්ටික් ද්‍රව්‍ය මිශ්‍ර කිරීමේ ඒකකයේ ධාරිතාව වැඩිවන පරිදිත් ඉවතලන ද්‍රව්‍ය (Sludge) ඉවත් කිරීමේ පද්ධතියට නව නළ පද්ධතියක් ස්ථාපනය කිරීමටත් හැකිවන පරිදිත්

අදාළ නවීකරණ කටයුතු සිදුකරන ලද අතර එය අඛණ්ඩව නිෂ්පාදන ක්‍රියාවලිය පවත්වා ගැනීමේ හැකියාව වර්ධනය කිරිමට උපකාරි විය. එසේම, නිෂ්පාදිත ඉන්ධන ගබඩා කිරීමට හැකිවන පරිදි ගබඩා ධාරිතාව ලීටර් 93,230 ක් දක්වා වර්ධනය කරන ලදී.

කෙසේ වුවද, වෙළඳපොළේ තරගකාරී සහ ආදේශන ඉන්ධන පැවතීම හේතුවෙන් මෙම ගැටළු මගහරවා ගැනිම සඳහා මෙම ඉන්ධන භාවිතයෙන් විදුලිය උත්පාදනය කිරීමේ හැකියාව සොයා බැලීම සඳහා පර්යේෂණ ආරම්භ කර ඇත. ඩීසල්වලින් ක්‍රියාත්මකවන එන්ජිමක් සවිකර ඇත. පර්යේෂණ ප්‍රතිඵල අනුව විදුලිය නිපදවීම සඳහා මෙම ඉන්ධන භාවිතා කළ හැකි බවට තහවුරු වී ඇත. කි.වො.පැය 150ක ධාරිතාවයෙන් යුත් තාපාංක යන්ත්‍රය පර්යේෂණ කටයුතු සඳහා හොරණ කර්මාන්ත ශාලාවේ ස්ථාපිත කර ඇත.

එසේම, 2017 ජූනි 07 දින ඛනිජතෙල් සම්පත් සංවර්ධන ගරු අමාත්‍යතුමා සහ නිළධාරීන් පිරිසක් මෙම කර්මාන්ත ශාලාව සම්බන්ධයෙන් අධ්‍යයන චාරිකාවක නිරත විය. පරිසරයට මුදාහරින ප්ලාස්ටික් හා පොලිතීන් අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයකින් අවම වන අයුරිනුත් ඉතා ඉහල ලාභදායීත්වයකින් මෙම කර්මාන්තය සිදුකරගෙන යා හැකි අයුරිනුත් අඛණ්ඩව කටයුතු සිදුකිරීමේ අරමුණින් එහි වර්තමාන තත්ත්වය පිළිබඳව ද සාකච්ඡා කරන ලදී. මෙම සන්දර්භය තුළ, රජයට වැය බරක් නොවන අයුරින් රජයේ අවම මැදිහත්වීමක් මත කර්මාන්තශාලාවේ මෙහෙයුම් කටයුතු නවෝත්පාදක ආනන්ද විතානගේ මහතාට භාරදෙමින් පොලිප්ටෝ ලංකා (පුද්) සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය පියවර ගනු ලැබුණි. ඒ අනුව, එකී ප්‍රතිව්‍යුගතකරණ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩයේ අනුමැතිය ලබා ගැනීමට 2018.08.02 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදුව 2018.08.21 දින අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එය අනුමත කරන ලදී. 2018.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විතානගේ මහතා සමඟ ගිවිසුමක් අත්සන් කර පොලිප්ටෝ ලංකා (පුද්) සමාගම එතුමාට භාරදෙන ලදී

## 8. දේශීය වෙළඳපොළේ මිළ විචලනය

අතීතයේ ශ්‍රී ලංකාවේ ඉන්ධන මිලගණන් නියම කිරීම් සලකා බැලිමේදී, සමහර විට එකම වර්ෂයේ එක් වරකට වැඩි අවස්ථාවලදී පවා, අවස්ථා කීපයකදී මිලගණන් සංශෝධනය කර තිබෙන බව පැහැදිලිය. 2005 දෙසැම්බර් මස 31 දින සිට මේ දක්වා ප්‍රධාන ඛනිජතෙල් නිෂ්පාදනවල සිල්ලර අලෙවි මිලගණන් 8.1 වගුව පෙන්නුම් කරන අතර, පෙට්‍රල් 92, ඔක්ටේන්, ඔටෝ ඩීසල් හා භූමිතෙල් යන ප්‍රධාන නිෂ්පාදන තුනේ මිලගණන් සංශෝධනයන්හි ප්‍රවනතාව 8.1 ප්‍රස්ථාරයෙන් පෙන්වයි.

**8.1 වගුව** ඛනිජතෙල් නිෂ්පාදනවල සිල්ලර අලෙවි මිලගණන් - 2015 දෙසැම්බර් 31 දිනට සිට 2018 දෙසැම්බර් 31 දක්වා (රු/ලීටර)

| වසර | නිෂ්පාදන වර්ගය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පෙට්‍රල් 90 ඔක්ටේන් (අ) | පෙට්‍රල් 95 ඔක්ටේන් | ඔටෝ ඩීසල් (ආ) | සුපිරි ඩීසල් | භූමිතෙල් | දැව් තෙල් | | |
| | | | | | | 1000 Sec | 1500 Sec | 3500 Sec |
| 2005 | 80.00 | 83.00 | 50.00 | 55.30 | 30.50 | 31.40 | 30.30 | 26.00 |
| 2006 | 92.00 | 95.00 | 60.00 | 65.30 | 48.00 | 44.40 | 43.30 | 41.00 |
| 2007 | 117.00 | 120.00 | 75.00 | 80.00 | 68.00 | 52.70 | 51.70 | 46.65 |
| 2008 | 120.00 | 133.00 | 70.00 | 85.30 | 50.00 | 33.90 | 31.70 | 25.00 |
| 2009 | 115.00 | 133.00 | 73.00 | 88.30 | 51.00 | 34.90 | 32.70 | 26.00 |
| 2010 | 115.00 | 133.00 | 73.00 | 88.30 | 51.00 | 42.20 | 40.00 | 40.00 |
| 2011 | 137.00 | 155.00 | 84.00 | 106.30 | 71.00 | 52.20 | 50.00 | 50.00 |
| 2012 | 159.00 | 167.00 | 115.00 | 142.00 | 106.00 | 92.20 | 90.00 | 90.00 |
| 2013 | 162.00 | 170.00 | 121.00 | 145.00 | 106.00 | 92.20 | 90.00 | 90.00 |
| 2014 | 150.00 | 158.00 | 95.00 | 110.00 | 81.00 | 92.20 | 90.00 | 90.00 |
| 2015 | 117.00 | 128.00 | 95.00 | 110.00 | 49.00 | 82.20 | 80.00 | 80.00 |
| 2016 | 117.00 | 128.00 | 95.00 | 110.00 | 49.00 | - | 80.00 | 80.00 |
| 2017 | 117.00 | 128.00 | 95.00 | 110.00 | 44.00 | - | 80.00 | 80.00 |
| 2018 | 125.00 | 149.00 | 101.00 | 121.00 | 70.00 | 92.00 | 92.00 | 80.00 |

සටහන : (අ) 2014 ජනවාරි මස 01 දින සිට 90 ඔක්ටේන් වෙනුවට 92 ඔක්ටේන් හඳුන්වාදීම
